තේ ශක්ති

# තේ ශක්ති අරමුදල

"හිරු මෙන් සේවයට කැපවුණු"

## වාර්ෂික වාර්තාව - 2008



වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පටුන


| | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | 1 - 2 |
| දර්ශනය, මෙහෙවර, අරමුණු | 3 |
| මූල්‍ය ප්‍රගතිය | 4 |
| සංස්ථාපිත තොරතුරු | 5 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 6 - 9 |
| තේ ශක්ති ව්‍යාපෘති | 10 |
| අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | 11 - 12 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 13 - 17 |
| මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය | 18 - 23 |
| විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 24 |
| ආදායම් ප්‍රකාශනය | 25 |
| ශේෂ පත්‍රය | 26 - 27 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය | 28 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 29 - 38 |
| ගිණුම් සඳහා සටහන් | 39 - 65 |
| විගණකාධිපති වාර්තාව - 2008 | 66 - 83 |

# හැඳින්වීම

තේ ශක්ති අරමුදල යනු වසර 2000 අංක 47 දරණ තේ ශක්ති අරමුදල් පනත යටතේ ස්ථාපිත කරන ලද වාණිජ්‍ය මූල්‍ය ආයතනයක් වන අතර, මෙම ආයතනයේ ලියාපදිංචි කාර්යාලය අංක 384, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටුවා ඇත.

තේ ශක්ති අරමුදලේ ප්‍රධාන කාර්යභාරය වනුයේ,

- තේ කර්මාන්ත ශාලා දහතුනක් (13) (කර්මාන්ත ශාලා ව්‍යාපෘතිය) ලාභදායී හා උපාය සම්බන්ධී ව්‍යාපාර ඒකක ලෙස ක්‍රියාත්මක කිරීම.

- නිසි කලට පොහොර ලබා දීමේ තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය ගුණාත්මක භාවයට හා විශ්වාසනීයත්වයට හානි නොවන පරිදි ලාභදායී ලෙස පවත්වාගෙන යාම.

- කාර්යක්ෂම ලෙස තේ නිෂ්පාදනය කර දේශීය වෙළඳපොලේ බෙදා හැරීම.

- කුඩා තේ වතු හිමියන් සඳහා සමාජ රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදී පවත්වාගෙන යාම.

මෙම ක්‍රියාදාමයේ ඉලක්කය වනුයේ තේ ශක්ති අරමුදල මගින් කාර්යක්ෂමව හා ඵලදායීව තේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම තුළින් කුඩා තේ වතු හිමියන්හට ඔවුන් නිපදවන දළු තේ සඳහා කේවල් කිරීමේ හැකියාව ලබා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමය.

පහත දැක්වෙන සය (6) වැදෑරුම් අරමුණු සාක්සාත් කරගනු වස් තේ ශක්ති අරමුදල ස්ථාපනය කරන ලදි.

- තේ ශක්ති අරමුදලේ තේ කර්මාන්ත ශාලා සඳහා දළු තේ සපයන කුඩා තේ වතු හිමියන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වය නගා සිටුවීම සඳහා ඉතිරි කිරීමේ සිරිතට අනුබල දීම හා ඒ සඳහා කුඩා තේ වතු හිමියන් පුරුදු පුහුණු කරවීම.

- තේ කර්මාන්ත ශාලා සඳහා අවැසි යාවත්කාලීන කළ තාක්ෂණ ඥාණය සමගින් අඛණ්ඩව තාක්ෂණික දැනුම ලබාදීම හරහා තේ කර්මාන්තයට වැදගත් වන ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

- අඛණ්ඩ අධීක්ෂණය තුළින් සහ කොළඹ තේ වෙන්දේසිය තුළ සහ දේශීය වෙළඳපළ තුළ තේ ප්‍රමාණය වැඩි කිරීම තුළින් තේ ශක්ති තේ කර්මාන්තශාලා තුළ නිපදවෙන තේ සඳහා වන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වර්ධනය කිරීම.

- පොහොර කර්මාන්තයේ 2% ක කොටසක් අරමුදල විසින් අත්පත් කරගැනීම සහ එම කොටස නඩත්තු කිරීම.

- කුඩා තේ වතු හිමියන් සඳහා උපරිම ප්‍රතිලාභ සහතික කිරීම තුළින් සුභසාධක සමාජ රක්ෂණ ක්‍රමය සඳහා දායක වන ප්‍රතිලාභීන් වන කුඩා තේ වතු හිමියන්ගේ සංඛ්‍යාව උපරිමයක් කරා ගෙන යාම.

- තේ කර්මාන්තයට එල්ලවන අවධානම් හඳුනාගැනීම සහ එම අවධානම ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම සමඟින් 25% අඛණ්ඩව සහ දරණීය වර්ධන වේගයක් ළඟා කර ගැනීම.

ඉහත අරමුණු මෙම වර්ෂය තුළදී සාක්ෂාත් කරගනු වස් තේ ශක්ති අරමුදලේ අභිමතාර්ථ කෙතරම් සාර්ථකව ළඟාකරගත්තේ දැයි යන්නට මෙම වාර්ෂික වාර්තාව සාක්ෂි දරනු ඇත.

# දර්ශනය, මෙහෙවර හා අරමුණු

## දර්ශනය

කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික හා සමාජ සමෘද්ධියේ අභිවෘද්ධිය උදෙසා කැපවුණු විශිෂ්ඨත්වයේ කේන්ද්‍රය වීම තේ ශක්ති අරමුදලේ දර්ශනය වේ.

## මෙහෙවර

තේ ශක්ති අරමුදල කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම තුළින් එහි සාමාජිකයන්ගේ සමෘද්ධිය ඇති කිරීම.

## අරමුණු

- ❖ කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික හා සාමාජිකත්වය නගා සිටුවීම සඳහා ඉතිරි කිරීමේ සිරිතට අනුබල දීම හා ඒ සඳහා පුරුදු පුහුණු කිරීම.
- ❖ තේ කර්මාන්තයට වැදගත් වන ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
- ❖ කුඩා තේ වතු හිමියන්ගේ තේ නිෂ්පාදනය සඳහා ඇවැසි තේ කර්මාන්තශාලා අත්පත් කර ගැනීම හා වැඩි දියුණු කිරීම හා ඒ සඳහා ඇවැසි අනෙකුත් පහසුකම් සපයාදීම.
- ❖ මෙසේ වැඩිදියුණු කළ තේ කර්මාන්ත ශාලා තුළින් නිපදවෙන තේ වල අලෙවි ක්‍රම ප්‍රවර්ධනය කිරීම හා දියුණු කිරීම.
- ❖ කුඩා ඉඩම් හිමියන් වශයෙන් තේ නිෂ්පාදනයේ නිරත වී සිටින පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ඇවැසි අනෙකුත් සියළු පියවර ගැනීම.
- ❖ තේ කර්මාන්තය සඳහා ඇවැසි පොහොර වර්ග ආනයනය, නිෂ්පාදනය හා විකිණීම.
- ❖ රජයට අනුබද්ධිත ශක්තිමත් ස්වීය මූල්‍ය සැපයුම් ආයතනයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම.
- ❖ ආයතනයේ ශුද්ධ ලාභය සියයට දහයක (10%) අගයක අඛණ්ඩව පවත්වා ගැනීම.
- ❖ නොකඩවා පවත්වාගත් සියයට විසිපහ(25%) ක වර්ධන වේගයක් මුදුන් පමුණුවා ගැනීම.
- ❖ උවදුරු, අවධානම්, අනතුරු, ආදිය හඳුනා ගැනීම හා ක්‍රමවත්ව පාලනය කිරීම.

# මූල්‍ය ප්‍රගතිය

| | 2008 | 2007 | 2006 | 2005 | 2004 |
|---|---|---|---|---|---|
| ආදායම (රු මිලියන) | 1183.02 | 1388.47 | 772.27 | 817.10 | 753.31 |
| මෙහෙයුම් සඳහා වියදම් (රු මිලියන) | 1045.73 | 1143.07 | 642.28 | 695.73 | 632.42 |
| දළ ලාභය (රු මිලියන) | 137.28 | 246.4 | 129.99 | 121.38 | 120.88 |
| වෙනත් අදායම් (රු මිලියන) | 17.99 | 12.52 | 8.37 | 19.59 | 7.38 |
| මූල්‍ය පිරිවැය (රු මිලියන) | 11.12 | 0.75 | 0.60 | 12.77 | 0.53 |
| ශුද්ධ ලාභය/අලාභය (රු මිලියන) | (29.40) | 94.46 | 3.63 | 10.69 | 28.67 |
| ලාභාංශ (රු මිලියන) | ශූන්‍ය | 31.34 | 20.62 | ශූන්‍ය | ශූන්‍ය |
| මුළු වත්කම් (රු මිලියන) | 1188.00 | 1224.01 | 1021.72 | 1027.61 | 983.64 |
| ශුද්ධ වත්කම් (රු මිලියන) | 684.56 | 714.83 | 651.80 | 654.24 | 643.55 |
| යොදවන ලද ප්‍රාග්ධනයට ඵල ( %) | (1.54) | 7.78 | 0.41 | 2.28 | 0.30 |
| දළ ලාභ අනුපාතිකය (%) | 11.60 | 17.75 | 16.83 | 14.85 | 16 |
| ශුද්ධ ලාභ අනුපාතිකය (%) | (2.49) | 6.80 | 0.47 | 1.31 | 3.8 |
| ප්‍රවර්තන අනුපාතය (වාර ගණන) | 2.29:1 | 2.26:1 | 2.78:1 | 2.70:1 | 3.01:1 |

# සංස්ථාපිත තොරතුරු

| | |
|---|---|
| ව්‍යාපාර නාමය | : තේ ශක්ති අරමුදල |
| ලිපිනය | : අංක 384, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල.<br>දුරකථන අංක: 011-2784339, 011-2784340,<br>ෆැක්ස්: 011-2784333,<br>ඊ-මේල්: tsf@teashkthi.gov.lk |
| සංස්ථාපිත කරන ලද පනත | : වර්ෂය 2000 අංක 47 දරණ තේ ශක්ති අරමුදල් පනත |
| සංස්ථාපිත කරන ලද වර්ෂය | : 2000 |
| ව්‍යාපාරයේ ස්වභාවය | : තේ කොමසාරිස්වරයා විසින් පනවන ලද විධි විධාන වලට අනුව 100 % ක් කුඩා තේ වතු හිමියන්ගෙන් මිළ දී ගත් දළු තේ යොදා ගනිමින් තේ නිෂ්පාදනය සහ නෛතික වශයෙන් පිළිගත් මාගී ඔස්සේ නිෂ්පාදිත තේ විකිණීම.<br><br>නිර්දේශිත මිශ්‍රණ අනුපාත වලට අනුව පොහොර මිශ්‍රණ ප්‍රධාන වශයෙන් කුඩා තේ වතු හිමියන් හට සුළු ලාභයකට සැපයීම.<br><br>පාරිභෝගිකයා මූලික තේ සංයෝග දේශීය වෙළඳපොලේ බෙදා හැරීම. |
| විගණක | : විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| බැංකුකරු | : ලංකා බැංකුව |

## සභාපතිතුමාගේ පණිවිඩය

2008 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශනය සහ වාර්ෂික වාර්තාව මවිසින් ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටකිනි.

**දිවයිනේ වර්තමාන තත්ත්වය - ආර්ථික වර්ධනය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යා ලේඛණ වලට අනුව 2008 වර්ෂයේ මුල් භාගයේදී ශ්‍රී ලාංකීය ආර්ථිකය 6.6% ක යහපත් ආර්ථික වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර, සංසන්ධනාත්මකව බලන කල 2007 වර්ෂයේ මෙම වකවානුවේදී රටේ ආර්ථික වර්ධන වේගය 6.3% කි. කෙසේ වෙතත් මෙම ආර්ථික වර්ධන ගම්‍යතාව වර්ෂයේ දෙවන භාගය දක්වා පවතී යැයි අපේක්ෂා කළද, අධික සහ චංචල ඉන්ධන මිළ, සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතින අත්‍යවශ්‍ය ආහාර මිළ, ලෝක ව්‍යාප්ත මූල්‍ය අර්බුදය හමුවේ මන්දගාමී වන ලෝක ආර්ථික රටාවක් තුල, රට තුල පවතින අධික උද්ධමනය පාලනය කිරීම සඳහා යොදාගන්න ඉතා දැඩි මූල්‍යමය ප්‍රතිපත්ති රටේ ආර්ථික වර්ධන අපේක්ෂාවන් සුළු වශයෙන් මන්දගාමී කරමින් 2008 වර්ෂයේ රටේ සමස්ථ ආර්ථික වර්ධන වේගය 6.2% ට ආසන්න අගයක් ගෙන ඇති අතර සංසන්දනාත්මකව බලන කල 2007 වර්ෂයේදී වාර්තා වූ ආර්ථික වර්ධන වේගය 6.8% කි.

**කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය :**

ශ්‍රී ලාංකීය කෘෂි නිෂ්පාදන අංශය 6.6% වර්ධන වේගයක් සටහන් කර ඇති බව මහ බැංකුව වාර්තා කරන අතර මෙම වර්ධන වේගය මූලික වශයෙන් 2008 වර්ෂයේ මුල් භාගයේදී සිදුවූ තේ සහ වී නිෂ්පාදනයේ යථා තත්වයට පත්වීමේ ප්‍රථිඵලයක් වශයෙන් දකිනු ලැබේ. එහෙත් 2008 වර්ෂයේදී කෘෂිකර්මාන්ත අංශය 6.6% ක ප්‍රසාරණය වීමක් බලාපොරොත්තු විය. 2008 වර්ෂයේ මුල් මාස 8 තුල කෘෂිකාර්මික අපනයන අංශයේ ප්‍රගතියක් වැඩි දියුණු කළ ක්‍රියාකාරකම් නිසා වාර්තාවූ අතර, විශේෂයෙන් තේ, රබර් සහ සුළු අපනයන බෝග නිෂ්පාදනවල 12.7% ඉහළ යාමක් වාර්තා විය. 2007 වර්ෂයේදී නිෂ්පාදනය වූ තේ කිලෝ ග්‍රෑම් මිලියන 305 ට සාපේක්ෂව 2008 වර්ෂයේදී නිෂ්පාදන වූ තේ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 319 ක් වුවද, වර්ෂය අවසාන වනවිට තේ විකිණීමේ පූර්ණ ප්‍රත්‍යාවර්තනයක් සමඟ විකුණුම් ප්‍රමාණය ඊට අවුරුදු දෙකකට පෙර අගයකට පහත වැටීම සහ වට්ටෝරු ගත කරන ලද තේ විශාල ප්‍රමාණයක් නොවිකිණීම තේ කර්මාන්තයේ ඉලක්ක ලඟා කරගැනීම වළක්වාලන ලදී.

මාස කීපයක කාලයක් තුල දී ඉන්ධන මිළ ඇමෙරිකානු ඩොලර් 147 සිට ඇමෙරිකානු ඩොලර් 36 දක්වා පහත වැටීම නිසා මුළු ශ්‍රී ලාංකීය තේ නිෂ්පාදනයෙන් 75% කට වෙළඳපොලක් සැපයූ මැද පෙරදිග සහ පෙර සෝවියට් සමූහ ආණ්ඩුවේ රටවල මුදල් වල කැපී පෙනෙන අවප්‍රමාණ වීම, සහ ඔවුන්ගේ ආර්ථිකයේ විශාල සෝදා පාළුවක් සිදු වීමේ අනිසි ප්‍රතිඵලයක් ලෙස කොළඹ තේ වෙන්දේසියේ සමස්ථ තේ මිළෙහි 35% පහළ යාමක් වර්ෂයේ අවසාන කාර්තුවේ දී වාර්තා විය. එමනිසා නිල සංඛ්‍යා ලේඛන ආර්ථික වර්ධන අපේක්ෂාවන් හුවා දැක්වුවද මාගේ විශ්වාසය වනුයේ අවම වශයෙන් 2009 වර්ෂයේ කාර්තු දෙකකදී වත් තේ වෙළඳ පොල ශක්තිමත්ව පැවතිය හැකි බවයි.

2009 වර්ෂයේ ජනවාරි මාසයේ ප්‍රථම තේ විකුණුම් කිහිපයක තේ වෙළඳපොල පිළිබඳව සුභවාදී වීමට තරම් හේතු නොරඳමින් එහි පිළි ලැබුම පිළිබඳව සැක මතුකලද මෙම වර්ෂය තුලදී සාම්ප්‍රදායික මිළදී ගැනීමේ රටා මත අනුමාන කිරීම් සඳහා ඉඩහසර නොසපයනු ඇත.

**තේ ශක්ති අරමුදලේ කාර්ය සාධනය**

2008 වර්ෂයේදී තේ ශක්ති අරමුදල රුපියල් මිලියන 29.4 ක ශුද්ධ අලාභයක් වාර්තා කරන ලදි. මෙම අගය ඊට පෙර වර්ෂයට සාපේක්ෂව 133% ක පහත වැටීමකි. තේ ශක්ති අරමුදලේ ප්‍රධාන කොටස් කරුවා වන කුඩා තේ වතු හිමියන්ගේ දළු තේ සඳහා සාධාරණ මිලක් ලබාදීමට කැපවීම, සහ එයට සබැඳි තේ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සහ කොළඹ තේ වෙන්දේසියේ තේ මිළ පහළ යාම වැනි කරුණු තේ ශක්ති අරමුදලේ ලාභ අන්තයන් සෝදා පාළුවකට ලක් කරලීමට සහ එහි මූල්‍ය ප්‍රවාහයට අනිසි බලපෑම් ඇති කිරීමට සමත් වී ඇත.

අන්තර් ජාතික වෙළඳපොළේ ඉන්ධන සහ අනෙකුත් වෙළෙඳ භාණ්ඩ වල පෙර නොදුටු විරූ මිළ ඉහළයාම් වලට සමගාමීව පොහොර වල මිළ ඉහලයාම පොහොර අංශයේ ලාභ සහ ආදායම් ඉලක්ක වලක්වා ඇත.

**තේ ශක්ති අරමුදල මුහුණ දෙන අභියෝග :**

තේ ශක්තී අරමුදලට අයත් තේ කර්මාන්ත ශාලා සියයට සීයයක් යැපෙනුයේ කුඩා තේ වතු හිමියන් විසින් සපයනු ලබන දළු තේ මතය. ක්ෂේත්‍රයේ පවතින දැඩි තරඟකාරී බව සහ පුද්ගලික අංශය විසින් නිර්මාණය කරන ලද කෘත්‍රිම දළු තේ මිළ ගණන් ආයතනයේ ලාභ සහ ආදායම් ඉලක්ක සපුරා ගැනීම සඳහා හැමවිටම බාධා පමුණුවයි.

වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ ලබාදීමේදී රජයේ විධි විධාන සහ වෘත්තීය සමිති කොන්දේසි පිළිපැදීම, කර්මාන්ත ශාලා මට්ටමේ මෙහෙයුම් තීරණ ගැනීමේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගනිමින් සුදුසුකම් ලත් වෑව්ලිකරුවන් බඳවා ගැනීමේ සහ රඳවා ගැනීමේ ඇති දුෂ්කරතා, සහ පුද්ගලික අංශයේ මෙන් ඉහළ වැටුප් සහ පහසුකම් සැපයීමට නොහැකි වීම නිසා දක්ෂ කර්මාන්තශාලා නිලධාරීන් සහ පුහුණු ශ්‍රමිකයන් රඳවා ගැනීමේ ඇති අපහසුව ආදී කරුණු භාණ්ඩාගාර මුදල් වෙන් කිරීම් මත නොයැපෙන රජයේ ආයතනයක් වන තේ ශක්ති අරමුදලේ මෙහෙයුම් මත බලපානු ලබන ප්‍රතිෂේධක සාධක වේ.

මහින්ද චින්තන වැඩ පිළිවෙලට අනුව ගත් රජයේ ප්‍රතිපත්තියක් වන සහනදායී මිළක් වන රු.1000 කට කුඩා තේ වතු හිමියන් හට පොහොර මිශ්‍රණ ලබා දීම තුලින් ආදායම් සහ ලාභ වර්ධනය සඳහා කැපී පෙනෙන දායක වීමක් කිරීමට තේ ශක්ති අරමුදල හරහා උත්සාහ කළද, පොහොර නිශ්පාදනය සඳහා ගැනෙන අමුද්‍රව්‍ය වල මිළෙහි සීඝ්‍ර ඉහළ යාම සහ රජයේ පොහොර සහනාධාරය ගණනය කිරීම සඳහා යොදා ගන්නා මිළ සූත්‍රයට, යොදා ගන්නා පොහොර අමුද්‍රව්‍ය මිළෙහි යාවත්කාලීන කිරීමක් නොකිරීමද ආයතනයේ ලාභ සහ ආදායම් ඉලක්ක සපුරා ගැනීමට තදින් බලා ඇත.

රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම නිසා ආයතනයට වන මූල්‍ය හානි පූරණය කිරීම සඳහා ක්‍රියාශීලී යාන්ත්‍රනයක් නොමැති වීම ආයතනයට අභියෝගාත්මක වන අතර එම සාධකය තේ ශක්ති අරමුදලේ සහ පොහොර කර්මාන්තයේ පැවැත්මටද, මේ වනවිට තදබල තර්ජනයක් වී ඇත. කෙසේ වෙතත් පෞද්ගලික අංශය මෙම සංසිද්ධිය මැඩපවත්වා ගනුයේ කෙසේද යන්න පිළිබඳව දැනගැනීම සඳහා අවස්ථාවක් මේ දක්වා ලැබී නොමැත.

**අනාගතය පිළිබඳ විශ්වාසනීයත්වය :**

සංඛ්‍යා ලේඛනාත්මක පුරෝකථනයන්ට අනුව 2009 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට 6.5 ත් 7 ත් අතර අගයක් කරා ලඟා වියයුතු අතර කෘෂිකාර්මික අංශය ද මේ සමඟ සීමිත වර්ධනයක් ලබා ගැනුමට අපේක්ෂිතය. කෙසේ වෙතත් ලෝක ආර්ථික අර්බුධය සහ ලකුණු පෙනෙන්නට තිබෙන ලෝක මූල්‍ය මන්දගාමීත්වය 2009 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආර්ථික වර්ධනයට කැපී පෙනෙන අවධානමක් ගෙන එනු ඇත.

තවත් අතකින් බලන කළ තේ කර්මාන්තයේ වර්ධනය, අස්වනු නෙලීමේ රටා, එහි ශ්‍රම මූලික ගති විද්‍යාව සහ කුඩා තේ වතු හිමියන් ආරක්ෂා කිරීම මෙහෙවර කරගත් තේ ශක්ති අරමුදලේ අසීමාන්විත කැපවීම බෝග සීමා කිරීමේ කළමනාකරණ ප්‍රතිපත්තියක් වෙත යොමු වීම සඳහා අවස්ථාවක් ලබා නොදෙනු ඇත. වෙළඳපොළේ බලවේග මත බලපෑම් ඇති කිරීමට හෝ එම බලවේග පාලනය කිරීමට අපට නොහැකි නමුදු නිර්ණය කරන ලද සීමාවන් තුල මෙහෙයුම් හෝ අත්‍යවශ්‍ය යෙදවුම් ප්‍රතික්ෂේප නොකර අපගේ පිරිවැය පාලනය කිරීමට අපට හැකියාව ඇත. ඉදිරි වර්ෂය සඳහා අප ආයතනය කේන්ද්‍රගත වනුයේ මෙම අරමුණ වෙතය.

**සමාප්තිය**

වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු දී. මූ. ජයරත්න මැතිතුමාට, සහ වැවිලි කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම්තුමාට ඔවුන් තේ ශක්ති අරමුදලේ පැවැත්ම සහ චිරස්ථිතිය උදෙසා දක්වන ලද සහයෝගය සහ යොමු කරන ලද උපරිම අවධානය වෙනුවෙන් මාගේ හදපිරි සතුට සහ අවංක කෘතඥතාව පලකිරීම සඳහා මවිසින් මෙම ඉඩහසර අවස්ථාවක් කර ගනිමි.

තවද මෙම වසර තුල කැපවීමෙන් අප ආයතනයට සේවය කල සියළු තරාතිරම්වල සේවක මහත්ම මහත්මීන්ට ස්තුති කිරීමද සැබැවින්ම අවැසිය. මා මේ අවස්ථාව අපගේ ගැණුම්කරුවන්ට, ඔවුන් අප වෙත දක්වන ලද අගනා අනුග්‍රහය වෙනුවෙන්ද, අපගේ වෙන්දේසිකරුවන්ට ඔවුන් අප වෙත දක්වන ලද මඳ නොවූ සහයෝගය වෙනුවෙන්ද, අපගේ සැපයුම් කරුවන් වෙත ඔවුන් අප වෙත සපයන ලද සේවාවන් සඳහා ද සහ අධ්‍යක්ෂ මණ්ඩලය හොබවනු ලබන මාගේ සගයන් වෙත ඔවුන්ගේ ප්‍රබල මගපෙන්වීම් සහ අවධානය වෙනුවෙන් ද මාගේ කෘතඥතාව පළකර සිටිමි.

.....................................................................

**නොයෙල් පද්මසිරි කාරියවසම්**
**සභාපති**
**2010 මාර්තු 04**

# තේ ශක්ති ව්‍යාපෘති

| කර්මාන්ත ශාලා ව්‍යාපෘතිය | කළමනාකරු | දුරකථන අංකය |
|---|---|---|
| ප්‍රධාන කළමනාකරු | කේ. බී. ඇටිපොල | 011-7421141 |
| බලංගොඩ තේ කර්මාන්ත ශාලාව | එම්. කරුණාරත්න | 045-7200823 |
| හිනිදුම තේ කර්මාන්ත ශාලාව | තිස්ස ජයවර්ධන | 091-7200537 |
| ඇල්පිටිය තේ කර්මාන්ත ශාලාව | ආර්. ගොඩකන්ද ආරච්චි | 091-7200541 |
| කොත්මලේ තේ කර්මාන්ත ශාලාව | කේ. මැදවල | 054-7200103 |
| කැප්පෙටිපොල තේ කර්මාන්ත ශාලාව | ඩී. ඊ. පී.ප්‍රේමරත්න | 057-7200065 |
| පස්සර තේ කර්මාන්ත ශාලාව | ඒ. යූ. ආර්. වීරසේකර | 055-7200174 |
| පන්සල්තැන්න තේ කර්මාන්ත ශාලාව | ඒ. පී. ඩී. කාරියවසම් | 066-7200176 |
| දෙණියාය තේ කර්මාන්ත ශාලාව | එස්. බණ්ඩාර | 041-7200320 |
| වලහන්දූව තේ කර්මාන්ත ශාලාව | ජේ. ආර්. සෙනෙවිරත්න | 091-7200608 |
| ගිලිමලේ තේ කර්මාන්ත ශාලාව | අක්‍රිය තේ කර්මාන්තශාලාවකි. | 045-7201524 |
| මහවැලි තේ කර්මාන්ත ශාලාව | කේ. බී. ඇටිපොල | 054-7200102 |
| මාවරල තේ කර්මාන්ත ශාලාව | එස්. කේ. ජයවර්ධන | 041-7200945 |
| රයිගම්කෝරලේ තේ කර්මාන්තශාලාව | එස්. පී. එදිරිසිංහ | 034-7200361 |

## පොහොර ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| කළමනාකරු - පොහොර සහ දේශීය තේ අලෙවි | ලක්ෂමන් එදිරිසිංහ | 0117-421134 |
| පොහොර මිශ්‍රණාගාරය - අරමනාගොල්ල - හොරණ | | 034-226056 |

<u>අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය</u>

<u>අධ්‍යක්ෂ මණ්ඩලය</u>

| | | |
|---|---|---|
| නොඑල් පද්මසිරි කාරියවසම් මයා | සභාපති | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය |
| එම්. ජේ. බී. ප්‍රනාන්දු මයා | අධ්‍යක්ෂ | ප්‍රධාන ගණකාධිකාරී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| පී. එම්. පී. ප්‍රනාන්දු මයා | අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ මුදල් හා ක්‍රමසම්පාදන ආමත්‍යාංශය |
| එස්. ඩී. නන්දසේන මයා | අධ්‍යක්ෂ | සාමාන්‍යාධිකාරී -කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය |
| නෙවිල් රත්නායක මයා | අධ්‍යක්ෂ | සභාපති, සමස්ථ ලංකා කුඩා තේ වතු සමිති සංවිධානය |
| ජේ. එම්. බී. ජේ. බණ්ඩාර මයා | අධ්‍යක්ෂ | සභාපති - රත්නපුර තේ වතු ප්‍රාදේශීය සමිති සමිති සංවිධානය |
| කුමාර ගුණසිංහ මයා | අධ්‍යක්ෂ | සභාපති - නුවරඑළිය තේ වතු ප්‍රාදේශීය සමිති සමිති සංවිධානය |
| බණ්ඩාර ගුණසේකර මයා | අධ්‍යක්ෂ | සභාපති- ඌව තේ වතු ප්‍රාදේශීය සමිති සමිති සංවිධානය |
| ජී. ජී. සෙනෙවිරත්න මයා | අධ්‍යක්ෂ | සභාපති - මහනුවර තේ වතු ප්‍රාදේශීය සමිති සමිති සංවිධානය |
| ජී. ඩබ්. ජයවර්ධන මයා | අධ්‍යක්ෂ | සභාපති- ගාල්ල තේ වතු ප්‍රාදේශීය සමිති සමිති සංවිධානය |
| කේ. එල්. ගුණරත්න මයා | අධ්‍යක්ෂ | සභාපති - කළුතර තේ වතු ප්‍රාදේශීය සමිති සමිති සංවිධානය |
| එච්. එන්. ආර්. ජයතිලක මයා | අධ්‍යක්ෂ | සභාපති - කෑගල්ල තේ වතු ප්‍රාදේශීය සමිති සමිති සංවිධානය |
| පී. එම්. පී. ප්‍රනාන්දු මයා | අධ්‍යක්ෂ | නියෝජ්‍ය අධ්‍යක්ෂ භාණ්ඩාගාරය |

## විගණන සහ කළමනාකරණ කමිටුව

| | | |
|---|---|---|
| පී. එම්. පී. ප්‍රනාන්දු මයා | අධ්‍යක්ෂ | නියෝජ්‍ය අධ්‍යක්ෂ, භාණ්ඩාගාරය සභාපති |
| එම්. එන්. ආර්. ජයතිලක මයා | අධ්‍යක්ෂ | සභාපති, කළුතර තේ වතු ප්‍රාදේශීය සමිති සමිති සංවිධානය - සාමාජික |
| එම්. ජේ. බී. ප්‍රනාන්දු මයා | අධ්‍යක්ෂ | ප්‍රධාන ගණකාධිකාරී, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, සාමාජික |
| නෙවිල් රත්නායක මයා | අධ්‍යක්ෂ | සභාපති, සමස්ථ ලංකා කුඩා තේ වතු සමිති සංවිධානය - සාමාජික |

## ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්

| | |
|---|---|
| ඒ. ජේ. එම්. ඩී. පී. බී. අවිරුප්පොල මයා | ප්‍රධාන විධායක නිලධාරී |
| පී. පී. කුඩාබණ්ඩා මයා | ප්‍රධාන කළමනාකරු (කම්හල්) |
| පී. පී. ආර්. තිස්ස මයා | ප්‍රධාන ගණකාධිකාරී |
| පී. අබේනායක මිය | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| ඊ. ඒ. එදිරිසිංහ මයා | කළමනාකරු පොහොර දේශීය තේ අලෙවි |
| එස්. පී. එදිරිසිංහ මයා | ජ්‍යෙෂ්ඨ කර්මාන්ත ශාලා කළමනාකරු - රයිගම්කෝරළේ තේ කම්හල |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2008 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ කාර්ය සාධනය පිළිබඳව අප වාර්තා කරනුයේ කෘතඥතා පූර්වක සතුටක් පෙර දැරිවය. වැඩිවන සේවක වැටුප් සහ අනෙකුත් ආශ්‍රිත පිරිවැය ඉහළයාම් මධ්‍යයේ වුවද තේ ශක්ති අරමුදලේ කටයුතු පසුගිය වසර සමඟ සසඳා බලන විට යුක්තියුක්ත ලෙස කළමනාකරණය කර ඇත.

**මූලික ක්‍රියාකාරකම්**

තේ ශක්ති අරමුදලේ ප්‍රධාන සහ මූලික ක්‍රියාකාරකම් 10 වන පිටුවේ විස්තර කර ඇති අතර, සලකා බලනු ලබන වසර තුළදී මෙම ක්‍රියාකාරකම්වල ස්වභාවයේ කැපී පෙනෙන වෙනසක් සිදු වී නොමැත.

**මෙහෙයුම් ආදායම**

වර්ෂය තුළ මෙහෙයුම් අයභාරය සහ එම මෙහෙයුම්වල ප්‍රතිඵල මෙම වාර්තාවේ 6 සහ 9 වන පිටුවල දැක්වෙන තේ ශක්ති අරමුදලේ සභාපතිතුමාගේ පණිවුඩයේ ඇතුළත් වන අතර, මූල්‍ය මෙහෙයුම් සමාලෝචනය මෙම වාර්තාවේ 18 – 23 පිටුවල දක්වා ඇත.

**අනාගත සංවර්ධනය**

කෑගල්ල සහා නුවර දිස්ත්‍රික්ක වල සිටින කුඩා තේ වතු හිමියන් වෙත ළඟා වීම සඳහා දැරණියගල සහ යටිනුවර තේ කර්මාන්ත ශාලා සම්පූර්ණ කර විවෘත කිරීමට තේ ශක්ති අරමුදල සැලසුම් කර ඇත.

**විගණන කමිටුව**

විගණන කමිටුවට ඇතුළත් සියළු සාමාජිකයන් විධායක අධ්‍යක්ෂවරුන් නොවන අතර, ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව මෙම වාර්තාවේ 24 වන පිටුවට ඇතුළත් කර ඇත.

## ලාභ සහ විසර්ජන

2007 හා 2008 වර්ෂ වල පිරිවැය සහ මෙහෙයුම් වලින් ලද ලාභයේ විස්තර පහත පරිදි වේ.

| | 2008 (රුපියල්) | 2007 (රුපියල්) |
|---|---|---|
| ආදායම | 1,183,002,981 | 1,388,468,652 |
| වෙන්දේසියේ විකුණුම් ආදායම | 1,003,273,979 | 1,201,205,733 |
| දේශීය තේ විකුණුම් | 36,743,268 | 32,469,621 |
| පොහොර විකිණීම | 142,985,734 | 150,918,726 |
| වෙනත් ආදායම් | 17,996,555 | 12,516,685 |
| ශුද්ධ ආදායම | 155,272,827 | 258,912,113 |
| ආයතන හා පරිපාලන වියදම් | (143,954,398) | (138,818,183) |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | (29,597,332) | (24,883,029) |
| බදු පෙර මෙහෙයුම් ලාභය | (18,278,902) | 94,459,309 |
| මූල්‍ය වියදම් | (11,125,942) | (751,592) |
| ලාභාංශ | ශූන්‍ය | (31,343,870) |
| රඳවාගත් ලාභය | 24,224,781 | 53,629,625 |

### ලාභාංශ සහ සංචිත

සමාලෝචනය කරමින් පවතින වර්ෂය තුළ ලාභාංශ ප්‍රකාශයට පත් කර නැත.

### සංචිත

2008 දෙසැම්බර් මස 31 වන දිනට තේ ශක්ති අරමුදල සතු මුළු සංචිත ප්‍රමාණය රුපියල් 38,094,954.00 (මෙය 2007 වර්ෂයේ 68,361,435.00 කි.) වන අතර, සංචිතවල හැසිරීම 39 වන පිටුවේ දක්වා ඇත.

### සංස්ථාපිත සහනාධාර

2008 වර්ෂය තුළ සංස්ථාපිත සහනාධාර කිසිවක් ලැබී නොමැත.

**ප්‍රාග්ධන පිරිවැය**

තේ ශක්ති අරමුදල සතු දේපළ සහ යන්ත්‍ර සූත්‍ර ආදිය පිලිබඳ විස්තර සටහන් අංක 4 සහ 52 යන පිටුවල දක්වා ඇත.

**නිශ්චල දේපළ වල වෙළඳපළ අගය**

2008 දෙසැම්බර් මස 31 වන දිනට සටහන් අංක 4 සහ පිටු 52 යන පිටුවල සඳහන් කර ඇති වත්කම් හැර වෙනත් කිසිම නිශ්චල දේපළක් තේ ශක්ති අරමුදල සතුව නොමැත.

**දායක ප්‍රාග්ධනය**

රට පුරා විසිරී සිටින කුඩා තේ ශක්ති අරමුදල විසින් 2008 වර්ෂයේදී රුපියල් 208,959,130 ක ප්‍රාග්ධනයක් සඳහා දායක වී ඇත.(2007 වර්ෂයේදී මෙම ප්‍රාග්ධනය රුපියල් 208,959,130 කි.)

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට සහ සේවකයන් වෙනුවෙන් තේ ශක්ති අරමුදල විසින් ගෙවිය යුතු සියළු ව්‍යවස්ථාපිත ගෙවීම් 2008 වර්ෂය සඳහා ගෙවා නිමකොට ඇති බවට සියළු අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනීමේ සහ විශ්වාසයේ හැටියට සෑහීමකට පත් වී ඇත.

**බදුකරණය**

තේ ශක්ති අරමුදල විසින් ශ්‍රී ලාංකීය කෘෂිකර්ම අංශයට ලබා දී ඇති අවුරුදු 10 ක ආදායම් බද්දෙන් නිදහස් කිරීමේ වරප්‍රසාදය භුක්තිවිඳින බැවින් මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ආදායම් බදු සඳහා මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.

**නීති හා රෙගුලාසි වලට අනුකූලතාව දැක්වීම.**

අප දන්නා පරිදි තේ ශක්ති අරමුදල තුළ කිසියම් අධිකරණ පාත්‍රතාවක් තුළ බලපෑම් ප්‍රකාශයට පත්කළ යුතු හෝ මූල්‍ය ප්‍රකාශනය තුළ ද්‍රව්‍යමය මූල්‍ය ගැලපීමකට තුඩු දෙන්නා වූ නීති හෝ රෙගුලාසි කඩවීමක් වර්ෂය තුළදී සිදු වී නොමැත.

**අධ්‍යක්ෂවරු**

තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය පිලිබඳ විස්තර 11 වන පිටුවේ දක්වා ඇත.

**ගිවිසුම් සහ යෝජිත ගිවිසුම් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම.**

2008 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය තුළ දී තේ ශක්ති අරමුදල විසින් ඇති කරගත් හෝ ඇති කර ගැනීමට නියමිත වූ ගිවිසුම් සඳහා අරමුදලේ අධ්‍යක්ෂවරුන්ගේ සෘජු හෝ වක්‍ර බැඳීමක් නොමැත. සියළු අධ්‍යක්ෂවරු තමන් විසින් දරන්නා වූ අනෙකුත් අධ්‍යක්ෂ තනතුරු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල දැන්වීම් වලදී දැනුවත් කර ඇති අතර, එම නිසා ඔවුන්හට බැඳීමක් ඇති කරුණු වලදී ඔවුන් ඡන්දය පාවිච්චි කිරීමෙන් වැළකී සිට ඇත.

**පරිසර සංරක්ෂණය**

තේ ශක්ති අරමුදලේ සියළු ව්‍යාපාරික කටයුතු යම් හෝ විධියකින් පරිසරයට බලපෑම් කරනු ඇත. එම ව්‍යපාර කටයුතු වලින් පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සහ ඒ හා සම්බන්ධ අධිකාරීන්ට සහ රෙගුලාසිවලට දක්වන සහයෝගය සහ අනුකූලතාව ප්‍රවර්ධනය කිරීමත් තේ ශක්ති අරමුදලේ ප්‍රතිපත්තිය වේ.

**ශේෂපත්‍ර දිනයෙන් පසු සිදුවීම්**

වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුළ ප්‍රකාශයට පත්කළ යුතු හෝ ද්‍රව්‍යමය ගැලපීම් සිදුකළ යුතු සිදුවීම් කිසිවක් ශේෂ පත්‍රය පිළියෙළ කරනු ලබන දිනයේදී සිදු වී නොමැත.

**අඛණ්ඩභාවය**

මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයකින් පසු සහ කුඩා තේ වතු හිමියන්ගේ සහභාගීත්ව පුරෝකථන, අයවැය ලේඛන, ණය ගැනීමේ අවශ්‍යතාවන්, පවත්නා හිමිකම් සහ සම්භාව්‍යතාවන්, වෙනස් වන ව්‍යාපාර තත්ත්වයන් සඳහා ඇවැසි මූල්‍ය නව්‍යතාව, කළමනාකරණ ක්‍රමෝපායන් සහ ශක්තීන්, දුර්වලතා, අවස්ථාවන් සහ තර්ජන යන සාධක සලකා බැලීමෙන් පසු ද්‍රව්‍යමය වශයෙන් මෙහෙයුම් මෑතකාලීනව සීමා නොකොට ආයතනයේ මෙහෙයුම අනාගතය තුළද පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් සම්පත් තේ ශක්ති අරමුදල සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහිමකට පත්ව ඇත. එම නිසා මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී අඛණ්ඩභාවය යන මූලධර්මය මත පිහිටා කටයුතු කර ඇත.

**සියළු කොටස්කරුවන්හට සම සාධාරණ වීම.**

සියළු කොටස්කරුවන් විසින් අරමුදලට දක්වන අනුග්‍රහය ඉතා අගය කොට සලකන අතර, සියළු කොටස්කරුවන්ට අපක්ෂපාතීව සහ සමසාධාරණව සැලකීම සඳහා අරමුදල විසින් සියළු ප්‍රයත්නයන් දරණ ලදි.

**විගණකවරු**

2008 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශනයේ විගණනය විගණකාධිපතිවරයාගේ උපදෙස් මත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ ජේද අංක 154 (1) හි ඇති ප්‍රතිපාදන සහ 1971 අංක 38 දරණ මුදල් ආඥා පනතේ 13 (1) වගන්තිය ප්‍රකාර ප්‍රතිපාදන සමඟ ක්‍රියාවට නංවමින් සිදුකර ඇත.

# මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

තේ ශක්ති අරමුදලේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇත. තේ ශක්ති අරමුදලේ මෙහෙයුම් සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය තුළ දැක්වේ.

## අරමුදලේ ප්‍රතිඵල

වර්ෂය තුළදී ආයතනයේ මුළු පිරිවැයම 2007 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 1183 සිට රුපියල් මිලියන 1388.5 දක්වා 15% කින් පහළ ගොස් ඇත.

කොළඹ තේ වෙන්දේසිකරුවන් හරහා නිෂ්පාදිත තේ විකිණීමෙන් ආයතනය උපයාගත් ආදායම රුපියල් මිලියන 1003 කි. මෙම අගය 2007 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 1030.7 න් 27% ක පහළ යාමකි.

මෙම වර්ෂයේදී ආයතනයේ පොහොර විකිණීමේ මුළු පිරිවැටුප රුපියල් මිලියන 143.67 කි. මෙය 2007 වර්ෂයේ මුළු පොහොර විකුණුම් පිරිවැටුප වූ රුපියල් මිලියන 151.64 ට සාපේක්ෂප 5.25% ක පහළ යාමකි. මෙම පෙහොර විකුණුම් පිරිවැටුප තුළ "මහින්ද චින්තනය" වැඩසටහන යටතේ විකුණන ලද පොහොර වල පිරිවැටුප ද අඩංගු වේ. වර්ෂය තුළ තේ වගා අංශයේ පවත්වාගෙන ගිය අයහපත් අලෙවිකරණය තත්ත්ව යටතේ තේ වගාකරුවන් යැපුම් වගා ක්‍රමයකට යොමු වූයේ යැයි අනුමාන කළ හැකිය.

වර්ෂය තුළ දේශීය තේ වෙළදාමේ ද 63% තීව්‍ර පිරිහීමක් වාර්තා කරමින් විකුණුම් අගය රුපියල් මිලියන 12.13 ට පහළ වැටිණි. 2007 වර්ෂයේ දේශීය තේ විකුණුම් ප්‍රමාණය රුපියල් මිලියන 32.5 කි.

## මුළු පිරිවැටුප සඳහා පාර්ශ්වික දායකත්වය




**පසුගිය වසර 05 සඳහා මුළු පිරිවැටුමේ පාර්ශ්වික නියෝජනය (% ගණනින්)**

| කොටස | 2008 | 2007 | 2006 | 2005 | 2004 |
|---|---|---|---|---|---|
| වෙන්දේසිකරුවන් මගින් විකුණුම් | 87% | 86.5% | 83% | 85% | 85% |
| පොහොර විකුණුම් | 12% | 11% | 14.5% | 11% | 11% |
| දේශීය වෙළඳපොලේ තේ විකුණුම් | 1% | 25% | 25% | 4% | 34% |

තේ ශක්ති අරමුදලේ කළමනාකාරීත්වය එම ආයතනයේ පාර්ශවික යැපුම වැඩි මෙහෙයුම් අවධානමක් සහිත කරුණක් ලෙස සලකන අතර, ඒ සඳහා දැඩි අවධානයක් යොමු කර ඇත. එම නිසා මෙම අවධානම අඩුකරනු වස් අනෙක් ව්‍යාපෘති/කොටස් දෙකෙහි දායකත්ව වැඩි කිරීම සඳහා සියළු පියවර ගතයුතු බවට කළමනාකාරීත්වය අදහස් කරයි.

**මෙහෙයුම් ප්‍රතිලාභ**

2008 වර්ෂයේදී ආයතනයේ පොලිය සහ බදු අඩුකිරීමට පෙර ඉපයීම් 119% කින් පහළ ගොස් ඇති අතර, ආයතනයට සිදු වූ රුපියල් මිලියන 18.29 ක අලාභය මෙම ඉපයීම් පහළ යාමට සෘජුව බලපා ඇත. ආයතනයේ ශුද්ධ ලාභය 130% කින් රුපියල් මිලියන 29.4 ක අලාභයක් දක්වා පහතට ගොස් ඇත. එම නිසා 2008 වර්ෂයේ පොලිය සහ බදු අඩු කිරීමට පෙර ඉපයීම රුපියල් මිලියන 95 ක අලාභයකි. 2007 වර්ෂයේ මෙම අගය වන රුපියල් මිලියන 94.46 ට සාපේක්ෂව 2008 වර්ෂයේ මෙම අගය 200% කින් පහළ යාමකි.

මෙයට අමතරව ආයතනයේ ආදායම 15% කින් අඩු වී ඇත. 6.7% කින් සෘජු විකුණුම් පිරිවැය වැඩිවීම සහ 2008 වර්ෂයේදී පොලී වියදම 1379% කින් , රුපියල් මිලියන 11.32 ක් දක්වා ඉහළ යාම මෙම පොලිය සහ බදු අඩුකිරීමට පෙර ඉපයීම් සහ ශුද්ධ ලාභය අඩුවීමට බලපා ඇත. 2007 වර්ෂයේදී පොලී වියදම වූයේ රුපියල් 751,592 ක් පමණි.

<u>දල/ශුද්ධ ලාභයේ සහ පිරිවැටුමේ දල විශ්ලේෂණය</u>




---

**<u>තේ ශක්ති කර්මාන්ත ශාලා ව්‍යාපෘතියේ, ශ්‍රී ලාංකේය තේ කර්මාන්තයේ සහ ලෝක තේ නිෂ්පාදනයේ සැසඳීම. (කිලෝ ග්‍රෑම් මිලියන)</u>**

| අවුරුද්ද | ලෝක තේ නිෂ්පාදන | ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන | තේ ශක්ති ව්‍යාපෘතියේ තේ නිෂ්පාදන |
|---|---|---|---|
| 2008 | 3750 | 318.07 | 4.807 |
| 2007 | 3761 | 304.6 | 4.480 |
| 2006 | 3573 | 310.8 | 4.754 |
| 2005 | 3458 | 317.2 | 4.065 |

**පොහොර ව්‍යාපෘතිය**

තේ ශක්ති අරමුදල විසින් පොහොර ව්‍යාපෘතියක් හොරණ, අරමනාගොල්ලේ දී ආරම්භ කර ඇති අතර, එයින් නිපදවෙන පොහොර දේශීය ගොවීන් වෙත විකිණේ. මෙහිදී තේ, රබර් හා කුරුඳු වගාවන් සඳහා ඇවැසි පොහොර වර්ග නිෂ්පාදනය කරනු ලැබේ. "මහින්ද චින්තනය" සංකල්පය යටතේ කුඩා තේ වතු හිමියන් සඳහා පොහොර සහනාධාර ක්‍රමයක් දියත් කිරීමත් සමඟ මෙහි නිපදවෙන පොහොර වලින් වැඩි ප්‍රමාණයක් විකිණෙනුයේ මෙම පොහොර සහනාධාර ක්‍රමය යටතේය. වසරක් තුළදී පොහොර අංශය රුපියල් මිලියන 143 ක පිරිවැටුමක් වාර්තා කරන ලදි. 2007 වසර සමඟ සසඳා බලන විට මෙම අගය 5.3% ක අඩුවීමකි. 2007 වසරේ මෙම අගය රුපියල් මිලියන 151 කි. පොහොර සහනාධාරය ගණනය කරනු ලබන මිළ සූත්‍රය සහ ඒ හා ඈඳුණු පොහොර ඉල්ලුම පහළ යාම පොහොර විකුණුම් අන්තය අඩුවීම සඳහා තදින් බලපෑ කරුණුය.

**තේ ශක්ති ව්‍යාපෘතියේ පොහොර විකිණුම් සහ ශ්‍රී ලංකාවේ පොහොර යෙදීම සැසඳීම. (මෙට්‍රික් ටොන් 000')**

| | 2008 | 2007 | 2006 | 2005 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාවේ පොහොර යෙදීම. | 131.8 | 157.2 | 165.4 | 178.2 |
| තේ ශක්ති පොහොර විකිණීම. | 2.0 | 3.8 | 4.4 | 5.6 |

සක්‍රීය අලෙවිකරණ යාන්ත්‍රණයක් නොමැති වීම නිසා 2005 ට පසු වර්ෂවලදී විකුණුම් ඉලක්ක ළඟා කර ගැනීමට අපහසු වී ඇත. පොහොර වෙළඳපොලේ 5% ක කොටසක් සඳා කර ගැනීම සඳහා තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය තුළ විභවයක් ඇති බවත් මේ සඳහා විශේෂයෙන් කුඩා තේ වතු හිමියන්ගේ සංවර්ධන සමිති සමඟ වඩා කිට්ටුවෙන් වැඩ කළ යුතු බවත් කළමනාකරණය අදහස් කරයි.

**දේශීය තේ වෙළඳාම**

දේශීය තේ විකුණුම් තුළින් තේ ශක්ති අරමුදල රුපියල් මිලියන 7.97 ක මුදලක් 2008 වර්ෂය තුළ උපයාගත් අතර, මෙම අගය ඊට පෙර වර්ෂයේ විකුණුම් අගය වන රුපියල් මිලියන 6.32 ට සාපේක්ෂව 26% ක වැඩිවීමකි. අප ආයතනය තුළ නිෂ්පාදිත තේ රජයේ ආයතනවල සුභසාධක සංගම් සහ දැයට කිරුළ වෙළඳ ප්‍රදර්ශන හරහා විකිණීම වැනි ක්‍රම මගින් තේ විකිණීමට ගත් නොනවතින උත්සහායන් මෙම නව ප්‍රවණතාවය ළඟා කර ගැනීම සඳහා දායක විය. මනා තේ විකුණුම් යාන්ත්‍රණයක් බලගැන්වූයේ නම් ආයතනයේ දේශීය තේ වෙළඳාම තවදුරටත් ඉහළ නැංවිය හැකි බව දේශීය තේ විකුණුම් කළමනාකරුගේ මතය යි.

## දේශීය තේ විකිණුම්




### ශුද්ධ වත්කම්

ආයතනය සතු ශුද්ධ වත්කම් වල වාර්ෂික වටිනාකම පහළ යාම 4.23% කි. ක්‍ෂයවීම් සඳහා අඩු කිරීම නිසා ආයතනය සතු ශුද්ධ ක්‍ෂයවීම් සඳහා වාර්ෂික අඩු කිරීම් මත ආයතනය සතු දේපළ, යන්ත්‍රාගාර, උපකරණ, යන්ත්‍රසූත්‍ර ආදියේ වටිනාකම 4.23% කින් වාර්ෂිකව පහළ යනු ඇත. සමාලෝචනය කෙරෙන වර්ෂය තුළ ක්‍ෂයවීම් සඳහා අඩුකළ ප්‍රමාණය රුපියල් මිලියන 34.42 කි. ආයතනය සතු වත්කම්වල ක්‍ෂයවීම් සමඟ සසඳා බලන විට ආයතනය වසර තුළ මිළදී ගත් රුපියල් මිලියන 4 ක් වටිනා ස්ථිර වත්කම් ප්‍රමාණය නොසලකා හැරිය හැකි තරම් කුඩා වේ.

### ආයෝජිත ප්‍රාග්ධනය මත ඵල හා ශුද්ධ ලාභය



**සාමාජීය වගකීම වෙනුවෙන් දායකත්වය**

සමාජීය වගකීම වෙනුවෙන් අප ආයතනයේ දායකත්වය පහත ක්‍රමවේදයන් හරහා ලබාදෙනු ලැබේ.

1. **සුභසාධන රක්‍ෂණ ක්‍රමය**

   මෙම සුභසාධන රක්‍ෂණ ව්‍යාපෘතිය යටතේ මෙම රක්‍ෂණ ක්‍රමයේ සාමාජිකයන් වන කුඩා තේ වතු හිමියන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් රුපියල් මිලියන 11.62 ක් වන්දි වශයෙන් ගෙවා ඇති අතර, මෙහි රක්‍ෂණ වාරික වියදම රුපියල් මිලියන 8.9 ක් වේ.

2. **කුඩා තේ වතු හිමියන් සඳහා වන විශ්‍රාම වැටුප් ක්‍රමය**

   අවුරුදු 18 ත් 60 ත් අතර වයසේ පසුවන සුභසාධක රක්‍ෂණ ක්‍රමයේ සාමාජිකයන් වන කුඩා තේ වතු හිමියන්, ඔවුන් වෙනත් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ක්‍රමයකට දායක වී නොමැති නම් මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට සුදුසුකම් ලබන අතර, මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ 2008 වසර තුළ එහි සාමාජිකයන් සඳහා රුපියල් 172,571 ක මුදලක් ගෙවා ඇත. 2007 වර්ෂයේදී මෙසේ ගෙවන ලද මුදල රුපියල් 44,740 කි.

## තේ ශක්ති අරමුදල

## විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2008

තේ ශක්ති අරමුදලේ විගණන හා කළමනාකරණ කමිටුව 2008 වර්ෂයේ දී මෙම අරමුදල වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටුකරන ලදි.

අරමුදලේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා මෙම විගණන හා කළමනාකරණ කමිටුව වර්ෂය තුළදී ත්‍රෛමාසිකව මුණගැසින.

අරමුදලේ සියළු කටයුතු විනිවිදභාවයකින් යුතුව සහ ඉතා උසස් අන්දමින් කරගෙන යාම සඳහා නවක යෝජනා ඉදිරිපත් කිරීමටත් නිර්දේශ කිරීමටත් සහ ක්‍රියාත්මක කිරීමටත් මෙම කමිටුවට අවස්ථාව සැලසී තිබිණි.

මෙම කමිටුවේ මූලික අවධානය යොමු වූයේ ශ්‍රී ලාංකීය මහජනතාව සඳහා උපරිම ප්‍රතිලාභ ලබාදීම වෙනුවෙන් උපරිම සේවයක් ඉටුකිරීම සඳාහ අරමුදල සතු කර්මාන්ත ශාලා වලට අදාළ වන කටයුතු සහ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහාය.

අරමුදලේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණය යටතේ ස්ථාපනය කරන ලද අභ්‍යන්තර විගණක ඒකකය හරහා වැදගත් අභ්‍යන්තර පාලන ක්‍රියමාර්ග කීපයක් විශේෂයෙන් තේ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ අවදානමක් සහිත කලාප වෙනුවෙන් ගැනීමට හැකිවිය. අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් අරමුදලේ පාලන හා මූල්‍ය ක්ෂේත්‍ර තුළද නිසිලෙස යොදා ගන්නා ලදි.

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා කීපයකටද මෙම කමිටුව අප්‍රමාදව අවධානය යොමු කරන ලදි.

මෙම වසර තුළදී ආයතනයේ අවසාන ගිණුම් අයවැය ඇස්තමේන්තු සහ තේ ශක්ති අරමුදලේ සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර වැනි ආයතනික වශයෙන් ඉතාමත් වැදගත් තොරතුරු නිසිකලට ලබාදීමටද මෙම කමිටුව අනලස්ව කටයුතු කරන ලදි.

පී.අබේනායක
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සම්බන්ධීකාරක - විගණක හා කළමනාකරණ කමිටුව

# පේ ශක්ති අරමුදල

## 2008 දෙසැම්බර් මස 31 අවසන් වන වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම

| | සටහන | මෙම වර්ෂය (රු) | පසුගිය වර්ෂය (රු) |
|---|---|---|---|
| ආදායම | 1 | 1,183,002,981.22 | **1,388,468,651.57** |
| විකිණුම් පිරිවැය | 2 | (1,045,726,709.38) | **(1,142,073,224.29)** |
| දළ මෙහෙයුම් ලාභය | | **137,276,271.84** | **246,395,427.28** |
| අනෙකුත් ආදායම් | 3 | 17,996,555.30 | **12,516,685.65** |
| මුළු ආදායම | | **155,272,827.14** | **258,912,112.93** |
| පරිපාලන වියදම් | 4 | (143,954,397.62) | **(138,818,182.83)** |
| බෙදාහැරීමේ වියදම් | 5 | (29,597,331.82) | **(24,883,028.92)** |
| | | **(173,551,729.44)** | **(163,701,211.75)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ලාභය/(අලාභය)** | | **(18,278,902.30)** | **95,210,901.18** |
| මූල්‍ය පිරිවැය | 6 | (11,125,941.51) | **(751,591.86)** |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | | **(29,404,843.81)** | **94,459,309.32** |
| ඉදිරියට ගෙන ගිය ලාභය/(අලාභය) | 7 | **53,629,624.73** | **(9,485,814.80)** |
| විසර්ජනයට පෙර ලාභය | | **24,224,780.92** | **84,973,494.52** |
| ලාභාංශ | | | **(31,343,869.50)** |
| ඉදිරියට ගෙන ගිය ලාභය/(පාඩුව) | | **24,224,780.92** | **53,629,624.73** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ගිණුම් සඳහා ප්‍රකාශනයේ අත්‍යාවශ්‍යම කොටසකි.

## තේ ශක්ති අරමුදල

## 2008 දෙසැම්බර් මස 31 දිනට ශේෂපත්‍රය

| | සටහන | මෙම වර්ෂය (රු) | පසුගිය වර්ෂය (රු) (රු) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල යන්ත්‍රාගාර සහ උපකරණ | **8** | 487,519,214.67 | 515,437,685.53 |
| නොනිම් ප්‍රාග්ධන වැඩ | **9** | 21,743,139.42 | 21,743,139.42 |
| | | **509,262,354.09** | **537,180,824.95** |
| **නොමේරූ බෝග** | | | |
| තේ වගාව | **10** | 2,337,880.58 | 5,284,509.16 |
| අනෙකුත් වගාවන් | **10** | 9,367.00 | 80,364.96 |
| රබර් වගාවන් | **10** | | 564,419.00 |
| | | **2,347,247.58** | **5,929,293.12** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ සහ තොග | **11** | 202,132,527.38 | 198,637,464.19 |
| වෙළෙඳ පළ හැකියාවන් සහ අනෙකුත් ලැබිය යුතු දෑ | **12** | 168,848,661.20 | 179,330,351.87 |
| අත්තිකාරම් පෙර ගෙවුම් සහ තැම්පතු | **13** | 68,006,078.17 | 57,549,762.30 |
| කෙටි කාලීන ආයෝජන | **14** | 230,622,385.05 | 226,297,503.76 |
| අතැති හා බැංකුවේ ඇති මුදල් | **15** | (7,470,405.59) | 6,241,985.76 |
| අන්තර් ජංගම ගිණුම් | **16** | 14,260,427.73 | 12,845,901.90 |
| | | **676,399,673.94** | **680,902,969.78** |
| **මුළු වත්කම්** | | **1,188,009,275.61** | **1,224,013,087.85** |
| **සම කොටස් සහ හිමිකම්** | | | |
| කොටස් ප්‍රාග්ධනය | **17** | 208,959,130.00 | 208,959,130.00 |
| ටී. එස්. එච්. ඩී. ඒ (රාජ්‍ය) ආධාර | **18** | 437,505,030.22 | 437,505,030.22 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 13,870,173.86 | 14,731,809.86 |
| රඳවාගත් ඉපැයුම් /(පාඩු) | | 24,224,780.92 | 53,629,625.02 |
| **සම කොටස් වල එකතුව** | | **684,559,115.00** | **714,825,595.10** |

**සාමාජිකයන්ගේ සුභසාධක අරමුදල**

| | | | |
|---|---|---|---|
| සාමාජික දායක මුදල් | **19** | 133,853,375.58 | 133,465,892.58 |
| **ජංගම නොවන හිමිකම්** | | | |
| ටී. එස්. එච්. ඩී. ඒ | **20** | 74,048,541.30 | 74,048,541.30 |
| **ජංගම හිමිකම්** | | | |
| ණය හිමියෝ සහ ගෙවිය යුතු දෑ | **21** | 198,318,240.16 | 214,643,042.32 |
| බැංකු ණය | | 48,809,520.00 | |
| උපචිත වියදම් | **22** | 48,420,483.57 | 87,030,016.55 |
| | | **295,548,243.73** | **301,673,058.87** |
| **මුළු සම කොටස් සහ හිමිකම් වල එකතුව** | | **1,188,009,275.61** | **1,224,013,087.85** |

මෙහි දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සඳහා වන සටහන් අත්‍යාවශ්‍යයෙන්ම මෙම 2008 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ සංඝටනීය කොටසක් වේ.

| | | |
|---|---|---|
| නොඑල් පද්මසිරි කාරියවසම් | දයා අඹිරුප්පොල | පී.ජී.ආර්. තිස්ස |
| සභාපති | ප්‍රධාන විධායක නිලධාරී | ප්‍රධාන ගණකාධිකාරී |
| තේ ශක්ති අරමුදල | තේ ශක්ති අරමුදල | තේ ශක්ති අරමුදල |

## තේ ශක්ති අරමුදල
## 2008 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශණය

| | මෙම වර්ෂය (රු) | පසුගිය වර්ෂය (රු) |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ගැලීම්** | | |
| ප්‍රවර්ථන වර්ෂයේ ලාභය/අලාභය | (29,404,844) | 63,115,440 |
| ගැලපුම් | | |
| ක්ෂය වීම් | 34,421,221 | 29,666,782.53 |
| ප්‍රත්‍යාගණන අතිරික්ත | (861,636.00) | 93,642.01 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය** | **4,154,741** | **92,875,864** |
| තොග වැඩි වීම්/අඩුවීම් | (3,495,063.19) | (54,371,855.70) |
| ලැබිය යුතු අඩුවීම්/වැඩිවීම් | 10,481,690.67 | (33,652,454.60) |
| අත්තිකාරම්, පෙර ගෙවුම්, තැන්පතු වැඩිවීම්/අඩුවීම් | (10,456,315.87) | (11,973,231) |
| ගෙවිය යුතුදෑ අඩුවීම්/වැඩිවීම් | (16,324,802.16) | 56,454,360 |
| උපචිත වියදම් අඩුවීම්/වැඩිවීම් | (38,609,532.98) | 82,596,407 |
| අන්තර් ජංගම ගිණුම්/අරමුදල් මාරු කිරීම් වැඩිවීම් /අඩුවීම් | (1,414,525.83) | 2,179,331 |
| බැංකු ණය | 48,809,520.00 | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගැලපීම් | **(11,009,029)** | **41,232,556** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගැලපීම්** | | |
| ස්පර්ෂනීය වත්කම් අත්පත් කර ගැනීම | (4,003,375.76) | (2,400,633.38) |
| කෙටිකාලීන ආයෝජන | (4,324,881.29) | (147,632,012) |
| නොමේරූ වැවිලි වල ආයෝජන | 3,582,045.54 | (80,365) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගැලපීම්** | **(4,746,212)** | **(150,113,010)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ගැලපීම්** | | |
| සාමාජිකයන්ගේ යහසාධක අරමුදල | 387,483 | 219,191 |
| ගෙවන ලද ලාභාංශ | | |
| සංචිත අරමුදල් ගිණුම | | |
| **මූල්‍ය කටයුතු වලින් ශුද්ධ මුදල් ගැලපීම** | **387,483** | **219,191** |
| අත ඇති සහ බැංකුවේ ඇති මුදල් වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | (13,712,391) | (15,972,683) |
| වර්ෂ ආරම්භයේදී අත ඇති සහ බැංකුවේ ඇති මුදල් | 6,241,986 | 22,214,669 |
| වර්ෂ අවසානයේදී අත ඇති සහ බැංකුවේ ඇති මුදල් | (7,470,406) | 6,241,986 |

## තේ ශක්ති අරමුදල
## 2008 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති.

1. සංස්ථාපන තොරතුරු

1.1 පොදු තොරතුරු

තේ ශක්ති අරමුදල යනු වර්ෂ 2000 අංක 47 දරණ පාර්ලිමේන්තු පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද වානිජ්‍ය මූල්‍ය ආයතනයකි. මෙම අරමුදලේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ අංක 384, පන්නිපිටිය පාර, පැලවත්ත, තලවතුගොඩ යන ස්ථානයේය. මෙම අරමුදලේ මුඛ්‍ය අරමුණ වනුයේ තරඟකාරී වෙළඳපොල තුළ ගුණාත්මක තේ නිෂ්පාදනය තුළින් සහ කුඩා තේ වතු හිමියන්හට සාධාරණ මිළකට යෙදවුම් ලබාදීම තුලින් ඔවුන් විසින් නිපදවනු ලබන දළු තේ සඳහා හොඳ මිළක් ලබාදීම හරහා ඔවුන්ගේ ආර්ථික සහ සමාජ තත්ත්වය නගා සිටුවීමය. මෙම අරමුදලේ ව්‍යාපාරික ස්ථාන හොරණ, මාතර, ගාල්ල, බදුල්ල, නුවර, නුවරඑළිය සහ මාතලේ යන දිස්ත්‍රික්ක තුළ පැතිර ඇත.

1.2 සංසන්දනාත්මක තොරතුරු

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී අරමුදල විසින් පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගත ඇති අතර, එම ප්‍රතිපත්ති පසුගිය වසරේ යොදාගත් ප්‍රතිපත්ති වලට වෙනස් නොවන අතර, මෙම ප්‍රකාශනයට ගැලපෙන පරිදි ඇවැසි තැන්හිදී වාක්‍ය ඛණ්ඩ නැවත පිළියෙළ කිරීමක් පමණක් කර ඇත.

1.3 මුඛ්‍ය ව්‍යාපාර ක්‍රියාකාරකම්

මෙම අරමුදලේ මුඛ්‍ය ව්‍යාපාර කටයුත්ත වනුයේ තේ සහ පොහොර නිෂ්පාදනය සහ විකිණීමය.

1.4 සේවක සංඛ්‍යාව

වර්ෂ අවසානය වන විට මෙම අරමුදලේ සේවය කරන සේවක සංඛ්‍යාව 255 ක් විය.

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1.1 පිළියෙළ කිරීමේ පදනම

තේ ශක්ති අරමුදලේ 2008 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශේෂ පත්‍රය, සමකොටස් සහ මූල්‍ය ප්‍රකාශයේ වෙනස්වීම් සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශනය) පිළියෙළ කර ඇත්තේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සහ 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණක ප්‍රමිතීන්ට අදාළ පනතට අනුකූලවය.

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කර තිබෙනුයේ ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලින් කාලානුරූප පදනමකිනි. උපලබ්ධි අගයන් සහ වෙළඳපොල අගයන් වශයෙන් වෙන වෙනම දක්වා ඇති පිළිවෙළින් නිෂ්පාදිත තේ සහ නිශ්චිත දේපළ ප්‍රත්‍යාගණනය කිරීම යන්ත්‍රාගාර සහ උපකරණ සහ වර්තමාන ආයෝජන හැරෙන්නට ඓතිහාසික පදනම යටතේ මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කර ඇත.

#### 2.1.2 විදේශ මුදල් පරිවර්තනය

විදේශ මුදල් මගින් සිදුවන සියළු ගනුදෙනු වාර්තාව පිළියෙළ කරනු ලබන මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලට එම ගනුදෙනු කෙරෙන දිනයේ බලපැවැත්වෙන විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කර තිබේ. ශේෂ පත්‍ර දිනට විදේශ මුදල් යටතේ බලපැවැත් වූ මූල්‍ය වත්කම් හා වගකීම් අවුරුද්ද අවසානයේ එම මොහොතෙහි බලපැවැත්වූ විදේශ විනිමය අනුපාතයන් අනුව පරිවර්තනය කර තිබේ. මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් එම වටිනාකම නිර්ණය කරන ලද දිනයේ බල පැවැත් වූ විදේශ විනිමය අනුපාතයන් අනුව පරිවර්තනය කර තිබේ.

#### 2.1.3 මව් හා උප ඒකක සබඳතාව

මෙම වර්ෂය තුළ තේ ශක්ති අරමුදල කිසිදු රජයේ හෝ පෞද්ගලික ආයතනයක් සමඟ මව් හෝ උප ඒකක සබඳතාවක් පවත්වා නැත.

2.1.4 ආදායම් බදු ගෙවීම.

ශේෂපත්‍ර දිනට රජය විසින් පනවා ඇති බදු අනුපාත උපයෝගී කොට ගෙන ආදායම් ප්‍රකාශනයේ සඳහාත් ගිණුම් ලාභය මත ආදායම් බදු ගණනය කිරීම සඳහා අරමුදලට විධිවිධාන ලබා දී නොමැත.

2.1.5 ණයට ගැනුම් පිරිවැය

ප්‍රාග්ධන ගත කර තිබෙන පවරා ගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදන අදාළ වත්කම් විෂයෙහි සෘජුව අන්තර්ගත නොවේ නම් එම ණය ගැනුම් පිරිවැය එම වියදම් කාල පරිච්ඡේදයේ වැය ලෙස හඳුනාගෙන තිබේ.

|---|---|
| අනුමත කොටස් ප්‍රාග්ධනය | 500,000,000.00 |
| **සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස් (වර්ණීය නොවන)** | |
| වර්ෂ ආරම්භයේ ශේෂය | 197,984,666.00 |
| අවුරුද්ද තුල ලැබීම් (සසඳන ලද) | 10,974,464.00 |
| **වර්ෂ අවසානයේ ශේෂය** | **208,959,130.00** |

## උපලේඛණය :- 18 ටී. එස්. එච්. ඩී. ඒ (රාජ්‍ය) ආධාර මුදල්

| | |
|---|---|
| 1998 වර්ෂය තුල ලද ආධාර මුදල් | 26,690,873.44 |
| 1999 වර්ෂය තුල ලද ආධාර මුදල් | 127,540,786.45 |
| 2000 වර්ෂය තුල ලද ආධාර මුදල් | 69,540,270.33 |
| 2001 වර්ෂය තුල ලද ආධාර මුදල් | 185,000,000.00 |
| 2002 වර්ෂය තුල ලද ආධාර මුදල් | 23,500,000.00 |
| 2004 වර්ෂය තුල ලද ආධාර මුදල් | 5,233,100.00 |
| **මුළු එකතුව** | **437,505,030.22** |

## උපලේඛණය :- 19 සාමාජික දායක මුදල්

| | |
|---|---|
| 2007/01/01 දිනට ශේෂය | 133,246,701.57 |
| 2007 වර්ෂයේ එකතු කිරීම් | 219,191.01 |
| 2008 වර්ෂයේ එකතු කිරීම් | 387,483.00 |
| **2005/12/31 දිනට අවසන ශේෂය** | **133,853,375.58** |

## උපලේඛණය :- 20 ටී. එස්. එච්. ඩී. ඒ

| | |
|---|---|
| කර්මාන්තශාලා | 58,001,047.37 |
| ප්‍රධාන කාර්යාලය- තේ ශක්ති අරමුදල | 2,151,761.41 |
| දේශීය තේ විකිණුම් | 4,206,269.39 |
| සුබසාධන | 9,689,463.13 |
| මුලු එකතුව | **74,048,541.30** |

<u>උපලේඛණය:- 21 - ණය හිමියෝ සහ ගෙවිය යුතු දෑ</u>

| විස්තරය | විස්තරය | කර්මාන්තශාලා | පොහොර | දේශීය විකිණුම් | සුබසාධන | කළමනාකරණ කර්මාන්ත ශාලා | තේ අපනයන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ගෙවිය යුතු දෑ | | | | 4,713,110.01 | | 7,166,014.80 | | **11,879,124.81** |
| සී/ඒ කලුතර ප්‍රාදේශීය කාර්යාලය | 189,147.00 | | | | | | | **189,147.00** |
| සී/ඒ කෑගල්ල | 102,932.40 | | | | | | | **102,932.40** |
| සී/ඒ මාතර | 240,134.48 | | | | | | | **240,134.48** |
| සී/ඒ රත්නපුර | 249,040.94 | | | | | | | **249,040.94** |
| සී/ඒ වලහන්දූව | | | | 3,211.97 | | | | **3,211.97** |
| ණය හිමියෝ | 40,000.00 | 78294752.76 | | 3,194,697.75 | | | | **81,529,450.51** |
| උ.වි.ගෙ.බදු ගෙවිය යුතු | 129,897.43 | | | | | | | **129,897.43** |
| අනියම් වැටුප් ගෙවිය යුතු | 10,809.60 | | | | | | | **10,809.60** |
| මුද්දර ගාස්තු | 3,966.06 | | | 102.00 | | | | **4,068.06** |
| ටී.එස්.ඩබ්.එස්. ණය ගෙවිය යුතු | 50,000.00 | | | | | | | **50,000.00** |
| වෛද්‍ය අරමුදල | 70,089.21 | | | | | | | **70,089.21** |
| පොහොර ආනයනය සඳහා ගෙවිය යුතු | | | 52,743,600.00 | | | | | **52,743,600.00** |
| ආපසු දෙන ටෙන්ඩර්/අනෙකුත් තැන්පතු | | | 105,000.00 | 30,609.00 | | | | **135,609.00** |
| ආපසු දෙන නියෝජිත ගාස්තු | | | 50,000.00 | | | | | **50,000.00** |
| රැඳවුම් බදු ගෙවිය යුත | 4,445.51 | | 532,596.59 | | | | | **537,042.10** |
| රැඳවුම් බදු ගෙවිය යුතු කොට්ඨාශ | 2,060,709.05 | | | | | | | **2,060,709.05** |
| රැඳවුම් බදු ගෙවිය යුතු ප්‍රධාන කාර්යාලය | | | 1,076,378.61 | | | | | **1,076,378.61** |
| පාරිතෝෂික වෙන්කිරීම් | 1,185,340.10 | | | | | | | **1,185,340.10** |
| ලාභාංශ වෙන්කිරීම් | | | | | | | 208,129.90 | **208,129.90** |
| සුභසාධන ගෙවිය යුතු | | | 3,500,000.00 | | | | | **3,500,000.00** |
| කොත්මලේ තේ ශක්ති අරමුදල | | | | 1,723,570.80 | | | | **1,723,570.80** |
| ලංකා බැංකු ණය | | | | | | | | **-** |
| රක්ෂණ විලම්භනය | | | | | 9,245,881,05 | | | **9,245,881.05** |
| 2007 ලාභාංශ/දිරි දීමනා වෙන්කිරීම් | | | | | | | | **31,343,869.50** |
| එකතුව | **4,336,511.78** | **78,294,752.76** | **58,007,575.20** | **9,665,301.53** | **9,245,881,05** | **7,166,014.80** | **208,129.90** | **'198,318,240.16** |

උපලේඛණය:- 22 - උපචිත වියදම් හා ප්‍රතිපාදන

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | පොහොර | කර්මාන්ත ශාලා | දේශීය විකිණුම් | එකතුව |
|---|---|---|---|---|---|
| උපචිත වියදම් | | | 47,838,804.77 | | **47,838,804.77** |
| ක්ෂතිය ගාස්තු | | 28,371.50 | | | **28,371.50** |
| හංන්ෂින් ලංකා පුද්ගලික සමාගම | 209,000.00 | | | | **209,000.00** |
| දෙනියාය ප්‍රවාහන සේවය | | 8,742.00 | | | **8,742.00** |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | 45,342.74 | 4,538.19 | | | **49,880.93** |
| ශ්‍රී ලංකා විදුලබල මණ්ඩලය | | 4,165.00 | | | **4,165.00** |
| දිමනා | 2,173.99 | | | | **2,173.99** |
| ජේ ඩී බී ඊ ආරක්‍ෂක සේවය | 30,146.70 | | | | **30,146.70** |
| මාස්ටර් ස්කේල් සේවය | | 115,338.80 | | | **115,338.80** |
| පරිගණක අලුත්වැඩියාව | | 3,000.00 | | | **3,000.00** |
| ස්විඩිෂ් ටේඩිං | | 98,758.70 | | | **98,758.70** |
| කම්කරු වැටුප් ගෙවීම් | | 4,352.50 | | | **4,352.50** |
| අනෙකුත් වියදම් | | | | 27,748.68 | **27,748.68** |
| මුළු එකතුව | **286,663.43** | **267,266.69** | **47,838,804.77** | **27,748.68** | **48,420,483.57** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

(140)

මගේ අංකය / எனது இல / My Nomber } පීඩයි/අයි/ටීඑස්එෆ්/2008/20 | ඔබේ අංකය / உமது இல / Your No. } | දිනය / திகதி / Date } 2010 මැයි 12 දින

සභාපති
තේ ශක්ති අරමුදල

TEA SHAKTHI FUND
03 AUG 2010
Time.........
ADMINISTRATION DIVISION

තේ ශක්ති අරමුදලේ 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

තේ ශක්ති අරමුදලේ 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනතේ 13 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2009 නොවැම්බර් 24 දින අරමුදලේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්,යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA
දුරකථනය / தொலைபேசி / Telephone. } 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

## 1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, තේ ශක්ති අරමුදල 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2008 දෙසැම්බර් 31 දිනට තේ ශක්ති අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව අරමුදලේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද 2008 වර්ෂය සඳහා අරමුදලේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2009 අගෝස්තු 03 දින හා අවසන් මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 16 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) රු.12,144,114 ක් වූ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ප්‍රකාරව වෙන වෙනම ආයෝජනය කර නොතිබුණි.

(ආ) 2004 හා පෙර වර්ෂ වලදී ප්‍රාග්ධන දායකය ලෙස රජයෙන් ලැබී තිබුණු රු.437,505,030 ක රජයේ ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 ප්‍රකාරව ක්‍රමවත් පදනමක් මත අදාල පිරිවැය සමඟ එම කාල පරිච්ඡේද වලට අදාලව හිලව් කරනු වෙනුවට මුළු ස්කන්ධ ප්‍රාග්ධනයේ කොටසක් ලෙස දක්වා තිබුණි.

(ඇ) දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වාහන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

2.2.3 ගණකාධිකරණ අඩුපාඩු

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කර්මාන්තශාලා ගිණුම්වලට අනුව, රු. මිලියන 4 ක අත්තිකාරමක් පත්සලපැත්ත කර්මාන්තශාලාවට ලැබිය යුතු දැ යටතේ දීර්ඝ කාලයක සිට දක්වා තිබුණි. 19 වර්ෂයේ සිට වර්ෂ 30 ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමකට ගෙවන ලද කල්බදු කුලියක් මෙම මුදලින් නියෝජනය වන බවත් එය අදාල වර්ෂවල ලාභයට එරෙහිව සමානුපාතිකව අය කර නොතිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) රු.14,260,428 ක් වූ හඳුනා නොගත් අන්තර් ප්‍රාදේශීය ජංගම ගිණුම් ශේෂයන් එකිනෙක නිරවුල් කිරීමෙන් තොරව වර්ෂය අවසානයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. මින් රු.12,845,902 ක් 2004 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂයට අදාලව විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් කර තොතිබුණි.

TEA SHAKTHI FUND
03 AUG 2010
Time..........
ADMINISTRATION DIVISION

2.2.5 නොසැසඳූ ගිණුම්

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරියට ගෙන එනු ලැබූ ස්ථාවර වත්කම් ආරම්භක ශේෂ සහ ස්ථාවර වත්කම් සම්බන්ධ සමුච්චිත ක්ෂය ගිණුම්වල එකතුව අතර රු.2,499,376 ක් වූ වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් ලියා හැරි අගයන්හි රු.292,334 ක වෙනසක් අදාල උපලේඛන සමඟ සැසඳීමේදී නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ අදාළ බැංකු සතාථ කිරීම් සමඟ සසඳා නොතිබුණු තෙයින් පොහොර, ශුභ සාධන හා දේශීය තේ විකුණුම් අංශයන්හි ස්වයංක්‍රීය අලුත් කිරීම පදනම් කරගත් ස්ථාවර වත්කම් ගිණුම්වල රු.2,115,027 ක වෙනසක් නිරීක්ෂණය විය. පොලී ලැබීම් නියමිත දිනයන් තුළ ගිණුම් ගත නොකිරීම හේතුවෙන් මෙම වෙනස සිදු වී තිබුණි.

(ඈ) බැංකු සැසඳුම් ප්‍රකාශනවල සඳහන් බැංකු ශේෂයන් සමඟ සැසඳීම සඳහා ගෙන තිබුණු අදාල ශේෂයන් සමඟ සැසඳීමේදී 2008 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දැක්වෙන ප්‍රධාන කාර්යාලයට හා පොහොර අංශයට අදාල බැංකු ශේෂයන් හා අතර එකතුව රු.1,131,905 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඉ) 2008 දෙසැම්බර් මාසය සඳහා ගිණුම් දෙකකට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශනවලට අනුව පහත දැක්වෙන හඳුනා නොගත් ශේෂ දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙනැවිත් තිබූ අතර මෙම ශේෂ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

| | |
|---|---|
| සෘජු බැර | 2,139,280 |
| සෘජු හර | 94,436 |
| බැංකුවේ නොවූ එහෙත් මුදල් පොතේ මුදල් | 1,013,689 |
| නොසැසඳූ ශේෂ | 165,810 |
| නිකුත් කල එහෙත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් | 2,608,114 |

2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේදී "රුසියානු ලංකා බද්ධ ගිවිසුම" යටතේ රුසියාවට අපනයනය කරන ලද තේ තොගයක් සඳහා ලැබිය යුතු වූ රු.මිලියන 19.9 ක් ඇතුලත් රු.මිලියන 40.9 ක් සහ පෞද්ගලික තේ කර්මාන්ත ශාලා 14 කට ණය පදනම මත කරන ලද තේ විකුණුම් වලට අදාලව රු.මිලියන 21 ක් අයකර ගැනීමෙන් තොරව දීර්ඝ කාලයක සිට හිඟව පැවතුණි. එම ලැබිය යුතු ශේෂ අයකර ගැනීමේ හැකියාව සැක සහිත වූ අතර ගිණුම්වල බොල් හා අඩමාණ ණය ලෙස මුළු මුදල සඳහා ප්‍රතිපාදනයන් කර තිබුණි.

සභාපතිගේ අදහස් දැක්වීම් වලට අනුව "2002 වර්ෂයේදී රුසියාවට අපනයනය කරන ලද තේ සඳහා ලැබිය යුතු රු0.මිලියන 19.9 ක් අයකර ගත නොහැකි වූයේ සමස්ත තේ අපනයන තොගයම රුසියානු මාපියා සංවිධානයක් අතට පත් වූ බැවිනි. තේ ශක්ති අරමුදල විසින් නීතිපති දෙපාර්තමේන්තුව මගින් රුසියානු තානාපති කාර්යාලයේ සහාය ඇතිව කටයුතු ආරම්භ කරනු ලැබුවද එම උත්සාහයන් නිශ්ඵල විය. ණය පදනම මත රු. මිලියන 21 ක විකුණුම් වලින් පෞද්ගලික කර්මාන්තශාලා 14 අතරින් එක් කර්මාන්ත ශාලාවක් පමණක් ලැබිය යුතු ශේෂ නිරවුල් කිරීමට එකඟ වී ඇත." විධිමත් පරිපාටි අනුගමනය කර තිබුනේ නම් අවම වශයෙන් සැලකිය යුතු මුදලක් හෝ අයකර ගැනීමේ හැකියාවක් පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) කර්මාන්තශාලා ඉදිකිරීම සහ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා පෞද්ගලික පාර්ශ්ව 4 කට එකතුව රු.33,154,952 ක අත්තිකාරම් ලබා දී තිබුණද වර්ෂ 5 කට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි. කෙසේ වුවද රජයෙන් ප්‍රමාණවත් අරමුදල් නොලැබීම හේතුවෙන් මෙම කටයුතු අත්හැර දමා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) වර්ෂ දෙකකට වැඩි කාලයක සිට ලැබිය යුතු පහත දැක්වෙන ශේෂ නිරවුල් කිරීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(i) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් හා එහි සමිතිවලින් ලැබිය යුතු රු.2,271,821 ක මුදල

(ii) ගුහ සාධක අංශයට කර්මාන්තශාලා අංශයෙන් ලැබිය යුතු රු.9,863,514 ක පොලී මුදල්

(ඇ) පහත දැක්වෙන දීර්ඝ කාල පරිච්ඡේදයක සිට ලැබිය යුතු වූ ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(i) කර්මාන්ශාලා 11 කට අදාලව ලැබිය යුතු රු.1,873,188 ක් වූ එකතු කළ අගය මත බදු

(ii) දේශීය තේ විකුණුම් අංශය යටතේ වාහන තැන්පතු ලෙස දැක්වෙන රු.666,255 ක මුදල

(ඉ) රු.74,048,541 ක් වූ දිගුකාලීන හිඟ හිටි ශේෂය කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අනුව මෙම ශේෂය රු.74,001,446ක් විය. මෙම ශේෂය සැසඳීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අරමුදලේ කාර්මාන්තශාලා 07 කට ලොරි රථ මිලදී ගැනීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට 2008 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ ලෙස රු.6,443,977 ක් දක්වා තිබුණි. කෙසේ වුවද මෙම වාර්තාවේ දිනය දක්වා කිසිදු නිරවුල් කිරීමක් සිදු කර නොතිබුණු අතර ඒ හේතුවෙන් ලොරි රථ වල අයිතිය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් පවරා නොතිබුණි. පවත්තා නීතිවලට පටහැනිව මෙම ලොරි රථ ආදායම් බලපත්‍ර නොමැතිව ධාවනයේ පැවතුණි.

(උ) අමු තේ දළු සපයන්නන්ට පෙර වර්ෂය තුළ ගෙවන ලද රු.2,700,805 ක වැඩිපුර ගෙවීම මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

(ඌ) 2008 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය අනුව බැංකු ජංගම ගිණුම් තුනක එකතුව රු.949,398 ක් වූ ශේෂ සහ අරමුදලේ රු.1,112,690 ක බැංකු අයිරා ශේෂය දිගු කාලයක සිට අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම ශේෂ නිරවුල් කිරීමට කටයුත කර නොතිබුණි.

(එ) කර්මාන්තශාලා ගිණුම්වලට අනුව, 1999 සිට 2007 කාල පරිච්ඡේදය සඳහා කර්මාන්තශාලා 4 ක වතු සේවකයන් වෙත ගෙවන ලද රු.313,869 ක උත්සව අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි.

### 2.2.7 අවිනිශ්චිත ගිණුම්

එවකට කළමනාකරණ කර්මාන්තශාලා අංශයේ ණයගැතියෝ යටතේ රු.3,442,758 ක අවිනිශ්චිත ගිණුම් ශේෂයක් සහ කර්මාන්තශාලා අංශයේ කර්මාන්තශාලා 4 ක ලෙජර ගිණුම් යටතේ රු.16,341 ක අවිනිශ්චිත ගිණුම් ශේෂ 4 ක් 2004 වර්ෂයේ සිට ගිණුම්වල දක්වා තිබුණි. මෙම අවිනිශ්චිත ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.8 විගණනය සඳහා සාක්ෂි නොවීම

එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් පහත දැක්වෙන ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්තිරීක්ෂණය කළ නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ලබාගත නොහැකි වූ සාක |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ලැබිය යුතු සහතාධාර -පොහොර අංශය | 36,371,740 | විස්තරාත්මක උපලේඛ ශේෂ සනාථ කිරීම් ද විශ්ලේෂණ |
| (ආ) | ගෙවිය යුතු ගිණුම් - දේශීය තේ විකුණුම් අංශය සහ කළමනාකරණ කර්මාන්තශාලා අංශය | 11,879,125 | |
| (ඇ) | ණය හිමියෝ - දේශීය තේ විකුණුම් සහ ප්‍රධාන කාර්යාලය | 3,234,698 | |
| (ඈ) | වර්ෂය සඳහා ක්ෂය | 34,421,221 | විස්තරාත්මක උපලේ |
| (ඉ) | සමුච්චිත ක්ෂය | 83,461,806 | |
| (ඊ) | අවිනිශ්චිත රක්ෂණ වන්දි - ගෘහ සාධන | 9,245,881 | |
| (උ) | පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන- ප්‍රධාන කාර්යාලය | 1,185,340 | උපලේඛන |
| | - කර්මාන්තශාලාව | 10,958,774 | |
| (ඌ) | බැංකු ජංගම ගිණුම් | 8,066,986 | සනාථ කිරීම් |

## 2.2.9 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | රජයේ මුදල් රෙගුලාසි | |
| (i) | අංක 104 (2) | සමාලෝචිත වර්ෂය තුළදී වාහන තුනකට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| (ii) | අංක 110 | නැතිවීම් සම්බන්ධයෙන් වෙනම ලේඛන පවත්වා නොතිබුණි. |
| (iii) | අංක 387 | චෙක්පත් ලිවීමට පෙර බැංකු ගිණුම් වල ප්‍රමාණවත් ශේෂයන් තිබුණු බව සනාථ කර ගැනීම සඳහා ගෙවීම් නිළධාරීන් අවධානය යොමු කර නොතිබුණි. |
| (iv) | අංක 396 | වටිනාකම රු.3,974,434 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 215 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) | අංක 395 (ඩ) | බැංකු සැසඳුම් ප්‍රකාශ ඊළඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 7.3 (ඇ) වගන්තිය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | නව වැටුප් සහ උසස්වීම් යෝජනා ක්‍රම වලට අනුකූල වන සේ වැටුප් සංශෝධන, බඳවාගැනීම් සහ උසස්වීම් පරිපාටිය විගණන දිනය වන 2009 ඔක්තෝබර් 15 වන විටත් පිළියෙල කර නොතිබුණි. |
| (ඉ) | 2007 අගෝස්තු 03 දිනැති අංක එම්පී1/4/1/6 (අතිකාල) දරන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පැය 40 සීමාව ඉක්මවමින් 2008 ජනවාරි සිට අගෝස්තු දක්වා පස්සර කර්මාන්තශාලාවේ සේවකයන් හට රු.314,926 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ඊ) | 2005 ජූනි 24 දිනැති අංක ටීසී/ආර්/2005/1 හා 2008 මාර්තු 12 දිනැති අංක ටීසී/ආර්/2008/01 දරන තේ කොමසාරිස්ගේ චක්‍රලේඛ | තේ දළු ප්‍රවාහනය සඳහා හඳුන්වා දී තිබූ රේටයන්ට වඩා අඩු රේටයන් මහවැලි හා පත්සලතැන්න තේ ශක්ති කර්මාන්තශාලා මගින් අයකර තිබුණි. අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව අඩු රේටයන් අය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා පිළිවෙලින් රු.මිලියන 2.08 ක හා රු.මිලියන 2.3 ක පාඩු දරා තිබුණි. |

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---

3.1 මූල්‍ය සමාලෝචනය

---

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, අරමුදලේ මෙහෙයුම් වලින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිඵලය රු.29,404,844 ක පාඩුවක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.94,459,309 ක ලාභයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.123,864,153 ක පිරිහීමක් දැක්වුණි. පෙර වර්ෂය හා සැසඳීමේදී රු.198,447,503 කින් විකුණුම් පහළයාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. සභාපතිට අනුව "2008 සිට 2009 මැද දක්වා කාලපරිච්ඡේදය තුළ ලෝක වෙළඳපළ පසුබෑමෙන් වූ සමස්ථ තේ කර්මාන්තයේ විශාල පහත වැටීමට තේ ශක්ති අරමුදල මුහුණ දී තිබුණි."

3.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

2008 වර්ෂය සඳහා මූල්‍ය ආදායම 2007 වර්ෂය හා සැසඳීමේදී රු.මිලියන 103.6 කින් එනම් 40% කින් අඩු වී තිබුණු අතර කර්මාන්තශාලා විකුණුම් රු. මිලියන 174 කින් එනම් 14% කින් අඩු වී තිබුණි. අරමුදලේ කර්මාන්තශාලා ලාභය පෙර වර්ෂය හා සැසඳීමේදී රු.මිලියන 118 කින් එනම් 15 % කින් අඩු වී තිබුණි.

මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

කර්මාන්තශාලා කාර්ය සාධනය

-------------------------------------

(අ) නිෂ්පාදනය (කි.ග්‍රෑ.) කර්මාන්තශාලාවේ නම

| වර්ෂය | වලහන්දූව | බලන්ගොඩ | දෙණියාය | ඇල්පිටිය | හිලිමලේ | හිනිදුම | කැප්පෙටිපොල | කොත්මලේ | මහවැලි | මාවරල | [illegible]ස්සර | පත්සල තැන්න | රයිගම් කෝරලේ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) |
| 2004 | 483,011 | 294,342 | 447,190 | 359,177 | - | 131,460 | 247,142 | 262,530 | 550,423 | 423,652 | - | 248,712 | 530,482 | 3,978,121 |
| 2005 | 425,863 | 265,601 | 418,241 | 442,910 | 126,898 | 152,854 | 216,181 | 281,742 | 513,481 | 288,941 | 215,305 | 162,472 | 554,969 | 4,065,458 |
| 2006 | 448,560 | 219,689 | 403,317 | 370,257 | 58,381 | 130,874 | 182,866 | 325,826 | 564,573 | 178,911 | 217,554 | 146,349 | 448,560 | 3,695,717 |
| 2007 | 430,060 | 218,398 | 443,352 | 359,728 | 136,132 | 260,679 | 328,202 | 299,764 | 761,754 | 214,070 | 430,267 | 162,080 | 435,393 | 4,479,879 |
| 2008 | 328,902 | 236,181 | 362,019 | 305,722 | 103,656 | 117,190 | 335,648 | 306,975 | 749,879 | 170,915 | 417,012 | 237,718 | 415,690 | 4,087,507 |
| 2007 වර්ෂය සමඟ සැසඳීමේදී අඩුවීම්/වැඩි වීම් ප්‍රතිශතය | (23.5) | 8.1 | (18.3) | (15.0) | (23.8) | (55.0) | 2.2 | 2.4 | (1.5) | (20.1) | (3.0) | 45.8 | (4.5) | (8.7) |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය හා සැසදීමේදී සමාලෝචිත වර්ෂයේ සමස්ථ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 392,372 කින් එප[illegible] 8.7 කින් අඩු වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂය හා සැසදීමේදී බලන්ගොඩ, කැප්පෙටිපොල , කොත්මලේ, පත්සලතැන්න හැර අනිකුත් කර්මාන්තශාලාවල නිෂ්පාදනය 1.5% සිට 55% දක්වා පරාසයක් තුළ අඩු වී තිබුණි.

(ආ) විකුණුම් ආදායම

කර්මාන්තශාලාවේ නම

| වර්ෂය | වලහන්දුව | බලන්ගොඩ | දෙණියාය | ඇල්පිටිය | ගිලිමලේ | හිතිදුම | කැප්පෙටිපොල | කොත්මලේ | මහවැලි | මාවරල | පස්සර | පත්සල තැන්න | රයිගම් කෝරලේ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) |
| 2004 | 89,951 | 45,552 | 85,534 | 69,019 | - | 20,069 | 31,965 | 36,822 | 80,658 | 78,028 | - | 31,872 | 99,693 | 669,163 |
| 2005 | 83,624 | 40,459 | 81,025 | 85,140 | 19,595 | 25,938 | 20,747 | 44,233 | 79,924 | 53,798 | 29,468 | 23,579 | 104,472 | 692,002 |
| 2006 | 92,075 | 33,768 | 79,868 | 70,807 | 9,920 | 21,883 | 26,978 | 53,823 | 96,158 | 33,956 | 34,347 | 23,452 | 98,535 | 675,570 |
| 2007 | 132,673 | 54,059 | 139,833 | 102,709 | 35,937 | 79,463 | 77,860 | 70,877 | 188,484 | 67,415 | 101,072 | 35,308 | 137,330 | 1,223,020 |
| 2008 | 111,917 | 64,611 | 129,689 | 92,384 | 27,413 | 47,578 | 81,879 | 76,555 | 211,358 | 57,732 | 100,873 | 49,078 | 151,504 | 1,202,571 |
| 2007 වර්ෂය සමග සැසඳීමේදී අඩුවීම්/වැඩිවීම් ප්‍රතිශතය | (15.64) | 19.52 | (7.25) | (10.05) | (23.72) | (40.13) | 5.16 | 8.01 | 12.14 | (14.36) | (0.20) | 39.00 | 10.32 | (1.67) |

(i) පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ විකුණුම් ආදායම රු.20,449,000කින් එනම් 1.67 % කින් අඩු වී තිබුණි.

(ii) පෙර වර්ෂය හා සැසඳීමේදී කර්මාන්තශාලා 06 ක් හැර අනිකුත් කර්මාන්තශාලාවල විකුණුම් ආදායම 0.2% සිට 40% දක්වා අඩු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) පෙර වර්ෂය හා සැසඳීමේදී පත්සලතැන්න හා බලන්ගොඩ තේ කර්මාන්තශාලා විකුණුම් ආදායම පිළිවෙලින් 39% කින් සහ 20% කින් වැඩි වී තිබුණි.

ADMINISTRATION DIV * TEA SHA...
03 AUG 201
Time..........

(ඇ) කිලෝග්‍රෑමයකට විකුණුම් මිල

කර්මාන්තශාලාවේ නම

| වර්ෂය | වලහැන්දුව | බලන්ගොඩ | දෙණියාය | ඇල්පිටිය | ගිලීමලේ | හිනිදුම | කැප්පෙටිපොල | කොත්මලේ | මහවැලි | මාවරල | පස්සර | පත්සල තැන්න | රයිගම් කෝරලේ | සාමාන්‍ය මිල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2004 | 186 | 154 | 191 | 192 | - | 152 | 129 | 140 | 146 | 184 | - | 128 | 187 | 168 |
| 2005 | 196 | 152 | 193 | 192 | 154 | 169 | 132 | 157 | 155 | 186 | 136 | 145 | 188 | 172 |
| 2006 | 205 | 153 | 198 | 191 | 169 | 167 | 147 | 165 | 170 | 187 | 157 | 160 | 194 | 180 |
| 2007 | 304 | 240 | 309 | 282 | 254 | 298 | 233 | 234 | 246 | 312 | 230 | 225 | 313 | 268 |
| 2008 | 309 | 242 | 318 | 274 | 266 | 295 | 212 | 230 | 253 | 305 | 221 | 208 | 325 | 266 |
| 2007 වර්ෂය සමග සැසඳීමේදී අඩුවීම්/වැඩිවීම් ප්‍රතිශතය | 6 | 0.8 | 2.9 | 2.8 | 4.7 | (1.0) | (9.0) | (1.7) | 2.8 | (2.2) | (3.9) | (7.5) | 3.8 | (0.74) |

නිමි තේ කිලෝග්‍රෑමයකට සාමාන්‍ය විකුණුම් මිල 0.74% කින් අඩු වී තිබුණු අතර ඉකුත් වර්ෂය හා සැසඳීමේදී කර්මාන්තශාලා 7 ක හැර සාමාන්‍ය විකුණුම් මිල අඩු වී තිබුණි.

(ඇ) වර්ෂය සඳහා ලාභය/පාඩුව

කර්මාන්තශාලාවේ නම

| වර්ෂය | වලහන්දුව | ලත්ගොඩ | දෙණියාය | ඇල්පිටිය | ගිලීමලේ | හිනිදුම | කැප්පෙටිපොල | කොත්මලේ | මහවැලි | මාවරල | පස්සර | පත්සල තැන්න | රයිගම් කෝරළේ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) |
| 2004 | 7,335 | 1,348 | 9,134 | 5,248 | - | - | (1,636) | 1,086 | 4,950 | 8,232 | - | (489) | 13,925 | 52,709 |
| 2005 | 4,492 | (72) | 5,963 | 2,667 | (5,246) | 3,576 | (4,553) | 2,845 | 4,151 | 656 | (4,140) | (803) | 9,330 | 11,033 |
| 2006 | 5,907 | (4,652) | 4,821 | (1,411) | (3,798) | (4,257) | (4,712) | 1,808 | 3,374 | (4,010) | 130 | (1,089) | 5,550 | (2,137) |
| 2007 | 13,107 | (1,235) | 18,563 | 1,991 | (3,635) | (4,055) | 4,584 | (512) | 16,805 | 3,190 | 10,656 | (3,512) | 18,667 | 78,041 |
| 2008 | 1,940 | (4,813) | 6,709 | 13,298 | (8,645) | (10,015) | (4,199) | (7,430) | 3,266 | (1,946) | (1,032) | (11,015) | 10,712 | (39,766) |
| 2007 වර්ෂය හා සැසඳීමේදී අඩුවීම්/වැඩිවීම් ප්‍රතිශතය | (85.19) | (289.71) | (63.85) | (767.90) | (137.82) | (146.97) | (191.60) | (1,351.17) | (80.56) | (161.00) | (109.68) | (213.63) | (42.61) | (150.95) |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී කර්මාන්තශාලා අංශයේ ලාභය රු.117,807,000 කින් එනම් 150.95% කින් අඩු වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී අරමුදලේ සියලුම කර්මාන්තශාලාවල ලාභය 42% ක සිට 1351% දක්වා වූ පරාසයක් තුල අඩු වී තිබුණි.

(ඉ) අමු තේ දළු මිලදී ගැනීම

කර්මාන්තශාලාවේ තම

| වර්ෂය | වලහන්[illegible] | බලන්ගොඩ | දෙණියාය | ඇල්පිටිය | ගිලීමලේ | හිනිදුම | කැප්පෙටිපොල | කොත්මලේ | මහවැලි | මාවරල | පස්සර | පත්සල තැන්න | රයිගම් කෝරලේ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) |
| 2004 | 230906[illegible] | 1361212 | 2133050 | 1572912 | - | 649304 | 1153469 | 1267365 | 2579096 | 2014340 | - | 1122954 | 2503849 | 18666613 |
| 2005 | 205169[illegible] | 1277261 | 2000443 | 2060570 | 620418 | 766841 | 1007110 | 1306791 | 2389035 | 1422943 | 961796 | 769458 | 2642507 | 19276865 |
| 2006 | 21755[illegible] | 1070770 | 1945633 | 1731656 | 306699 | 651873 | 858653 | 1526066 | 2634676 | 916610 | 1009206 | 640497 | 2489687 | 18007591 |
| 2007 | 20909[illegible] | 1019880 | 2099483 | 1687326 | 679115 | 1282648 | 1503227 | 1387470 | 3395592 | 1035887 | 1940804 | 759657 | 2050534 | 20932525 |
| 2008 | 15802[illegible] | 1079336 | 1718593 | 1472881 | 494538 | 566154 | 1539038 | 1396819 | 3398601 | 872694 | 191983 | 1103400 | 1944701 | 19078944 |
| 2007 වර්ෂය හා සැසඳීමේදී අඩුවීම්/වැඩිවීම් ප්‍රතිශතය | (24.[illegible]) | 6 | (18.1) | (12.7) | (27.10) | (55.8) | 2.3 | 0.6 | 0.08 | (15.7) | (1.4) | 45.2 | (5.1) | (8.8) |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමස්ත අමු තේ දළු මිලදී ගැනීම 8.8% කින් අඩු වී තිබුණි.

(ii) වලහන්දුව,ගිලීමලේ සහ හිනිදුම කර්මාන්තශාලා අමු තේ දළු මිලදී ගැනීම සම්බන්ධයෙන් 24% සිට 55% දක්වා වූ පරාසයක් තුල සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කර තිබුණි.

3.2.2 මූල්‍ය කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තේ බ්‍රෝකර් සමාගමකින් අරමුදලේ තේ කර්මාන්තශාලා 5 ක තේ අලෙවි කිරීම සඳහා 2006 හා 2007 වර්ෂවලට අදාලව රු.19,211,584 ක් හා ඒ මත පොලී රු.540,580 ක් ලැබිය යුතු විය. කොළඹ තේ බ්‍රෝකර් සංගමයේ අංක 59/2007 දරන චක්‍රලේඛයේ 28 හා 29 (අ) වගන්තිවලට අනුකූලව දින 7 ක් ඇතුලත මුදල් ගෙවිය යුතු වුවද එම සමාගම මුදල් ගෙවීම් දීර්ඝ කාලයක් ප්‍රමාද කර තිබූ අතර 2009 ඔක්තෝබර් 15 විගණන දිනය වන විටත් එම බ්‍රෝකර් සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද එම බ්‍රෝකර් සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. දැනට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව සභාපතිවරයා මා වෙත දන්වා තිබුණද නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීමට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් වලට අනුව මෙම කර්මාන්තශාලා පහෙන් තුනක් පාඩු පිට පවත්වා ගෙන ගොස් තිබුණි.

(ආ) 2003 වර්ෂයේ සිට අරමුදලේ කර්මාන්තශාලා 5 ක ඉදිකිරීම් වලට අදාලව කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්වල රු.21,743,140 දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම ඉදිකිරීම් වැඩ නිම කර නොතිබුණි.

(ඇ) යටිනුවර සහ දැරණියගල තේ කර්මාන්තශාලා ඉදිකිරීමට ලංකා බැංකුවේ තේ සංවර්ධන ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදලින් රු.මිලියන 100 ක ණයක් සඳහා ඉල්ලුම් කර තිබුණු අතර 2007 නොවැම්බර් 30 දින රු.මිලියන 50 ක් ණයක් ලෙස ලැබී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i) රු.මිලියන 50 ක මුළු මුදලම අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගනු වෙනුවට භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර තිබුණි.

ii) තවද 2007 ජූලි සිට 2009 පෙබරවාරි කාල පරිච්ජේදය සඳහා භාණ්ඩාගාර බිල්පත් වලින් රු.7,478,407 ක් පොලී ලෙස උපයා තිබුණු අතර එම කාල පරිච්ජේදය සඳහාම මෙම ණය මුදල සඳහා පොලී ලෙස රු.10,345,039 ක් ගෙවා තිබුණි.ඒ නිසා අරමුදලට මෙම ගනුදෙනුවෙන් රු.2,866,632 ක පාඩුවක් දැරීමට සිදු වී තිබුණි.

iii) එම කර්මාන්තශාලා ඉදිකිරීම සඳහා උපයෝජනය කිරීමෙන් තොරව රු.මිලියන 50 ණය මුදල 2009 පෙබරවාරි 28 දින බැංකුවට ආපසු ගෙවා තිබුණු අතර මේ සම්බන්ධයෙන් වූ පාලන මණ්ඩල තීරණය විගණනයට ලැබී නොතිබුණි.

සභාපතිගේ අදහස් දැක්වීම් වලට අනුව "2008 වර්ෂය තුල වූ තේ කර්මාන්තයේ අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් රේබීය අමාත්‍යාංශය විසින් අර්බුදකාරී තත්ත්වය අවසන් වන තෙක් සියලු ප්‍රධාන ප්‍රාග්ධන වැඩ නතර කරන ලෙස තේ ශක්ති අරමුදලට උපදෙස් ලැබී තිබුණු බවත් එම මුදල තේ කර්මාන්තයේ අර්බුදය අවසන් වන තෙක් භාණ්ඩාගාර බිල්පත් වල තැන්පත් කල බවත්ය."

(ඇ) අරමුදල විසින් විධිමත් මූල්‍ය විනයක් සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ තුළ පවත්වා නොතිබුණි. ඒ හේතුවෙන් බැංකු ජංගම ගිණුම් වල වාසිදායක ශේෂයන් තිබුණද මුදල් පොතේ රු.7,470,406 ක බැංකු අයිරාවක් දක්වා තිබුණි. තවද දේශීය තේ විකුණුම් අංශයට අදාල 2008 වර්ෂය සඳහා බැංකු සැසඳුම් විගණනයට ලැබී නොතිබුණි.

(ඉ) අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව පත්සලතැන්න හා කොත්මලේ තේ කර්මාන්තශාලාවල 2007 වර්ෂයේ සිට වර්ණ විභේදන යන්ත්‍ර ක්‍රියාවිරහිතව පැවති අතර සමාලෝචිත වර්ෂය තුලදී රු.218,025 ක් හා රු.124,150 ක් අලුත්වැඩියා කිරීම සඳහා ගෙවා තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම වර්ණ විභේදන යන්ත්‍ර අලුත් වැඩියා කරමින් තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී වර්ණ විභේදනය සඳහා බාහිර පාර්ශවයන්ට රු.1,009,087 ක් ගෙවා තිබුණි.

(ඊ) කර්මාන්තශාලා කාර්යයසාධන වාර්තාවට අනුව වේලීම සඳහා ඉන්ධන/ දර සාමාන්‍ය පිරිවැය නිමි තේ කිලෝ ග්‍රෑමයකට රු.10.75 ක් විය. කෙසේ වුවද ඇල්පිටිය තේ ශක්ති කර්මාන්ත්ශාලාවේ වේලීම සඳහා දර වෙනුවට තනිකරම ඩීසල් යොදා ගැනීම හේතුවෙන් ඉන්ධන/දර සාමාන්‍ය පිරිවැය කිලෝ ග්‍රෑමයකට රු.38.08 ක් වූ විශාල පිරිවැයක් දරා තිබුණි.

3.2.3 වත්කම් කළමනාකරණය

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) 2007 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.971,532 ක් වූ පොලිතීන් තොග දේශීය තේ විකුණුම් අංශයේ ගබඩාවල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිෂ්ක්‍රීයව තබා තිබුණි. සභාපතිට අනුව "එවකට දේශීය විකුණුම් අංශය භාරව සිටි කුඩා තේ වතු සංවර්ධන

අධිකාරිය නමින් මෙම පොලිතින් තොග මුද්‍රණය කර ඇත. එහෙයින් තේ ශක්ති අධිකාරියට ඒවා භාවිතා කල නොහැක."

(ආ) ඇල්පිටිය තේ කර්මාන්තශාලාවේ සිදු වූ රු.403,524 ක ඩීසල් ඌනතාවය අයකර ගැනීමට ක්‍රියාත්මාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2008 පෙබරවාරි 24 සිට 2008 ජුලි 10 දක්වා කාල පරිච්ඡේදය තුල කොත්මලේ තේ කර්මාන්තශාලාවේ රු.1,221,950 ක මුදල් වංචාවක් සිදු වී තිබුණි. කෙසේ වුවද මෙම මුදල අදාල වගකිව යුතු නිලධාරීන්ගෙන් විගණන දිනය වන 2009 ඔක්තෝබර් 30 දක්වාම අයකර ගෙන නොතිබුණි. සභාපතිට අනුව "නීතිමය කටයුතු දැනට ආරම්භ කර ඇත. "

3.2.4 හඳුනා ගන්නා ලද පාඩු

---------------------------

පහත දැක්වෙන හඳුනාගත්නා ලද පාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2005 සහ 2006 වර්ෂ සඳහා දායක මුදල් ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් සේවක භාරකාර අරමුදලට රු.10,422 ක අධිභාර ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව 2008 ජනවාරි සිට අගෝස්තු දක්වා දෙනියාය තේ කර්මාන්තශාලාවේ පෞද්ගලික තේ විකුණුම් වලට අදාලව තේ වෙන්දේසියේදී නියම කරන ලද මිලට වඩා අඩුවෙන් විකිණීම හේතුවෙන් රු.190,775 ක පාඩු සිදු වී තිබුණි.

3.2.5 වාහන උපයෝජනය

------------------------

වාහන 16 ක ඇණියක් අරමුදල සතු විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඩබල් කැබ් රථ දෙකක් විගණන දිනය වූ 2009 සැප්තැම්බර් 15 දක්වා අලුත්වැඩියා කිරීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් පෞද්ගලික ගරාජවල නිෂ්ක්‍රීයව තබා තිබුණි.

(ආ) කුලී පදනම මත මෝටර් වාහන සපයන ආයතනවලින් මිල ගණන් කැඳවීමෙන් තොරව මෝටර් රථ 5 ක් 2008 වර්ෂය තුල කුලියට ගෙන තිබුණි. අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව 2008 වර්ෂය තුල ඒ මත සිදු කරන ලද ගෙවීම් රු.388,225 ක් විය.

(ඇ) අරමුදල විසින් වාහන ලේඛනය, ලොග් පොත් සහ වාහන සඳහා මාසික සාරාංශ පවත්වා නොතිබුණි. දෙනියාය තේ ශක්ති කර්මාන්තශාලාවේ වාහන දීර්ඝ කාලයක් සිට මයිලෝමීටර් නොමැතිව ධාවනය කෙරෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.2.6 ක්‍රියාකාරී සැලැස්ම

---

2008 වර්ෂය සඳහා විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.2.7 අයවැය ලේඛනමය පාලනය

---

(අ) අරමුදල විසින් සමාලෝචිත වර්ෂය සඳහා සමස්ත අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) අරමුදලේ එක් එක් අංශය වෙනුවෙන් පිළියෙල කරන ලද අයවැය ලේඛනයන්ට අනුව අයවැය ගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය හා ගිණුම් වාර්තා පැවැත්වීම

(ආ) මුදල් පාලනය

(ඇ) අන්තර් අංශ ජංගම ගිණුම්

(ඈ) කර්මාන්තශාලා මෙහෙයුම්

(ඉ) වාහන උපයෝජනය

(ඊ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

TEA SHAKTHI FUND
03 AUG 2010
Time..........
DIVISION

එස්. ස්වර්ණජෝති
විගණකාධිපති .